# කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය
# மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சு
# Ministry of Women and Child Affairs

# 2025



# කාර්යසාධන වාර්තාව
# செயற்றிறன் அறிக்கை
# Performance Report

# කාර්යසාධන වාර්තාව

# 2025

**කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය**

**(වැය ශීර්ෂ අංක - 171)**

## පටුන


| අන්තර්ගතය | පිටු අංක |
|---|---|
| **පරිච්ඡේදය 01** | |
| ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය | **01-10** |
| **පරිච්ඡේදය 02** | |
| ප්‍රගතිය හා ඉදිරි දැක්ම | **11-37** |
| **පරිච්ඡේදය 03** | |
| වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය | **38-53** |
| **පරිච්ඡේදය 04** | |
| කාර්යසාධන දර්ශක | **54-55** |
| **පරිච්ඡේදය 05** | |
| තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්යසාධනය | **56-59** |
| **පරිච්ඡේදය 06** | |
| මානව සම්පත් පැතිකඩ | **60-68** |
| **පරිච්ඡේදය 07** | |
| අනුකූලතා වාර්තාව | **69-76** |

# පරිච්ඡේදය 01

## ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 දැක්ම

**කාන්තාවන් හා ළමුන් සංවර්ධනයේ පූර්ණ ප්‍රතිලාභ හා අවස්ථාවන් සාධාරණව හා සමානව භුක්ති විඳින උසස් සමාජයක්.**

### 1.2 මෙහෙවර

**ජාතික ප්‍රමුඛතා හා අවශ්‍යතා මෙන්ම ජාත්‍යන්තර ප්‍රමිතීන් ද සැලකිල්ලට ගනිමින් කාන්තාවන් හා ළමුන්ගේ ආර්ථික සවිබලගැන්වීම හා සමාජ ආරක්ෂණය සඳහා අවශ්‍ය නෛතික, ප්‍රතිපත්තිමය, ආයතනික හා මානව සම්පත් වැඩිදියුණු කිරීම සඳහා වූ වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.**

## 1.3 හැඳින්වීම, කාර්යයන් හා කර්තව්‍යයන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2412/08 හා 2024.11.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය ස්ථාපිත විය. අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන් පහත පරිදි වේ.

1. රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කාන්තා හා ළමා කටයුතු විෂයයන්ට අයත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.
3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
4. කාන්තා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
5. රාජ්‍ය කටයුතුවලදී තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය සහ නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
6. ගැටුම්වලින් හා දරිද්‍රතාවයෙන් විපතට පත් කාන්තාවන් සවිබලගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
7. කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සඳහා වන නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
8. ලිංගිකත්වය හා ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට වෙනස් කොට සැලකීම වළක්වාලීම සඳහා පවත්නා නීති සංශෝධනය කර නව නීති හා ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
9. කාන්තා මූලික ගෘහ ඒකක සවිබලගැන්වීම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
10. කාන්තා හා ළමා කටයුතුවලට අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටු කර ගැනීම.
11. දේශපාලන ව්‍යුහයන් තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය අවම වශයෙන් 50%ක් දක්වා ගෙන ඒමට අවශ්‍ය නීති සහ ප්‍රතිපත්ති ක්‍රමිකව හඳුන්වා දීම.
12. ආර්ථව දරිද්‍රතාව අවසන් කිරීම වෙනුවෙන් අවශ්‍ය බදු සහන, මූල්‍ය සහ අනෙකුත් පහසුකම් ලබා දීම.
13. ස්ත්‍රීන්ගේ වැටුප් නොලබන සුරැකුම් ශ්‍රමයේ බර අඩු කිරීම.
14. ශාරීරික හා මානසික වශයෙන් නිරෝගී දරුවන් ඇති කරලීමේ අභිප්‍රායෙන් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම.
15. අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර සම්මතයන්ට ගැළපෙන සේ වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
16. ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
17. ළමා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම.
18. සෙවන සරණ කැපකරු මව්පිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
19. සුවිශේෂී කුසලතා ඇති දරුවන්ගේ එම කුසලතා ඔප්නංවා ගැනීම සඳහා මූල්‍යාධාර සැපයීම.

20. ස්ත්‍රීන්ට සහ දරුවන්ට වෙනස් කොට සලකන හා පීඩාවට ලක්කරන විශේෂ නීති සංශෝධනය කිරීම.
21. පහත දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු.
22. එම ආයතනයන් අධීක්ෂණය කිරීම.


වගකීම් පැවරෙන අංශ/ දෙපාර්තමේන්තු/ආයතන

i. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය
ii. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
iii. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
iv. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය
v. ජාතික කාන්තා කමිටුව
vi. ජාතික කාන්තා කොමිසම 2024 අංක 37 දරන කාන්තා සවිබලගැන්වීමේ පනතට අනුව, 2025 සැප්තැම්බර් මාසයේදී පිහිටුවන ලදි.

තවද, ඉහත ආයතන සඳහා අවශ්‍ය පරිපාලන හා මෙහෙයුම් සහාය ලබා දීමට ආයතන අංශය, අභ්‍යන්තර විගණන අංශය, සංවර්ධන අංශය, ගිණුම් අංශය සහ සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය ක්‍රියාත්මක වේ.

ඒ අනුව, අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන වැය ශීර්ෂ අංක 171 යටතේ ක්‍රියාත්මක වන අතර පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ 217 යටතේ ද ක්‍රියාත්මක වේ. මෙම කාර්යසාධන වාර්තාව මඟින් වැය ශීර්ෂ අංක 171ට අදාළ ප්‍රගතිය දක්වා ඇත.

## 1.4 සංවිධාන සටහන


කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය
ගරු අමාත්‍යතුමිය
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා
ලේකම්
දෙපාර්තමේන්තු/ව්‍යවස්ථාපිත ආයතන
අතිරේක ලේකම් (පාලන) (ශ්‍රී ලං.ප.සේ විශේෂ) (1)
අතිරේක ලේකම් (සංවර්ධන) (ශ්‍රී ලං.ප.සේ විශේෂ)(1)
ප්‍රධාන මූල්‍ය නිලධාරී (ශ්‍රී ල.ග.සේ විශේෂ) (1)
අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන) (ශ්‍රී ල.ක්‍ර.සේ විශේෂ) (1)
ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී ල.ග.සේ/I) (I)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ශ්‍රී ලං.ප.සේ) (1)
අධ්‍යක්ෂ සංවර්ධන (ශ්‍රී.ල.ප.සේ) (1)
අධ්‍යක්ෂ (කාන්තා කාර්යාංශය) (ශ්‍රී.ල.ප.සේ) (1)
අධ්‍යක්ෂ (මුල්ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්.) (ශ්‍රී.ල.ප.සේ(1)
ප්‍රධානගණකාධිකාරී (ශ්‍රී.ල.ග.සේ I) (1)
අධ්‍යක්ෂ (සැලසුම්) (ශ්‍රී.ල.ක්‍ර.සේ) (1)
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
ජාතික කාන්තා කමිටුව
සහකාර ලේකම් (පාලන) ශ්‍රී ල.ප.සේ( II/III) (2)
නීති නිලධාරී( දෙපාර්තමේන්තුගත( /II III)(2)
නි.අධ/ සහකාර අධ්‍යක්ෂ සංවර්ධන ශ්‍රී.ල.ප.සේ (II/III) (1)
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං ප.සේ)(II/III) (3)
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ) (II/III) (4)
ගණකාධිකාරී ( ශ්‍රී ල.ග.සේ) (II/III) (2)
නියෝජ්‍ය සහකාර/ අධ්‍යක්ෂ (සැලසුම්) ශ්‍රී ල.ක්‍ර.සේ(II /III) (3)
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (තො.තා) (I)
අභ්‍යන්තර විගණක (ශ්‍රී ල.ග.සේ )(II/III) (1)
පරිපාලන නිලධාරී (ක.සේ.නි.සේ අධි පන්තිය) (1)
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී (ක.සේ.නි.සේ) (I)
භාෂා පරිවර්තකක (ශ්‍රී ලංකා භාෂා පරිවර්තන සේවය)(I/ විශේෂ) (2)
උපදේශන නිලධාරී (I/II) දෙපාර්තමේන්තුගත (13)
සහාය කාර්ය මණ්ඩලය (තොරතුරු තාක්ෂණ නිලධාරී/සංවර්ධන නිලධාරී /වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාර/පුස්තකාලයාධිපති/ කළමනාකරණ සේවා නිලධාරී / තොරතුරු තාක්ෂණ සහකාර/ පිළිගැනීමේ නිලධාරී /නේවාසිකාගාර පාලිකා/වීඩියෝ කැමරා ශිල්පී/රියදුරු,කාර්යාල කාර්යය සහායක ඇතුළු ප්‍රාථමික සේවයේ නිලධාරීන්)

## 1.5 අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු/ ආයතන හා අංශ

### පාලන අංශය

#### හැඳින්වීම

අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතනවල මානව සම්පත් හා භෞතික සම්පත් කළමනාකරණය සඳහා ආයතන රෙගුලාසි හා චක්‍රලේඛවලට අනුකූලව මෙන්ම අවස්ථානුකූලව කටයුතු කිරීම සඳහා පාලන අංශය ක්‍රියාත්මක වේ. පාලන අංශය මඟින් පහත සඳහන් කාර්යයන් ඉටු කරමින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතනවලට කාර්යක්ෂම සේවාවක් ලබාදේ.

#### ප්‍රධාන කාර්යභාරය

අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අයත් සියලුම ආයතනවල කාර්ය මණ්ඩලයට අදාළ ආයතනික හා පරිපාලන කටයුතු මෙහෙයවීම, දේශීය හා විදේශීය පුහුණුවීම් ලබාදීම තුළින් මානව සම්පත් හැකියා සංවර්ධනය කිරීම, අමාත්‍යාංශ විෂය පථයට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ, පනත් කෙටුම්පත් ආදිය නිසි පරිදි ඉදිරිපත් කිරීම මඟින් ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම, අවශ්‍ය මානව සම්පත් ලබා දීමට කටයුතු කිරීම, මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, මහජන දුක් ගැනවිලි සම්බන්ධව කටයුතු කිරීම, පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම, පාර්ලිමේන්තු උපදේශක කාරක සභා කටයුතු, පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනා, ස්ථාවර නියෝග ඇතුළු සියලුම පාර්ලිමේන්තු කටයුතු සම්බන්ධීකරණය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාවන් පාර්ලිමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම, ජනාධිපති කාර්යාල, අග්‍රාමාත්‍ය කාර්යාලය හා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කටයුතු සම්බන්ධීකරණය හා තොරතුරු දැන ගැනීමේ පනත සම්බන්ධ කටයුතු කිරීම ප්‍රධාන කාර්යභාරයන් අතර වේ.

### සංවර්ධන අංශය

#### හැඳින්වීම

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති හා නීති සම්පාදනය හා ජාතික මට්ටමේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ මූලික වගකීම දරන සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ අමාත්‍යාංශය යටතේ වන ආයතන මඟින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම, කාන්තා හා ළමා විෂයට අදාළ එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතන, අනෙකුත් විදේශීය මෙන්ම දේශීය ආයතන සම්බන්ධීකරණය කිරීම, ජාතික මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම හා ඇගයීම් සිදුකිරීම වේ. තවද, ජාත්‍යන්තර සම්මුතීන් එකඟතා ආදිය සඳහා කාන්තා හා ළමා සංවර්ධනයට අදාළව යාවත්කාලීන වාර්තා සකස් කිරීම ද මූලික වගකීමක් වේ.

#### ප්‍රධාන කාර්යභාරය

කාන්තාවන් හා ළමුන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව බැඳී සිටින විවිධ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මුතීන් හා ප්‍රඥප්තීන් ක්‍රියාත්මක කරන රාජ්‍ය යාන්ත්‍රණයේ ප්‍රධාන පාර්ශ්වකරුවා වන කාන්තා සහ ළමා කටයුතු විෂයභාර අමාත්‍යාංශයෙහි, අනුබද්ධ ආයතන

විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම, එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතන හා විදේශීය මෙන්ම දේශීය ආයතන සම්බන්ධීකරණය කිරීම, ජාතික මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම, පසුවිපරම මෙන්ම කාන්තාවන්ගේ හා ළමුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ප්‍රවර්ධනය කිරීම, සමානාත්මතාවය තහවුරු කිරීම හා ඔවුන්ගේ පූර්ණ සංවර්ධනයට ඉවහල් වන ප්‍රතිපත්ති හා නීති අණපනත් හා ජාතික මට්ටමේ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම ප්‍රධාන කාර්යභාරයන් වේ.

## ගිණුම් අංශය

මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සපයා ගැනීම, කළමනාකරණය කිරීම හා ගෙවීම් සිදුකිරීම සමඟම, රාජ්‍ය ගිණුම් පවත්වා ගනිමින් විනිවිදභාවයකින් යුතුව, මුදල් රෙගුලාසි මඟින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත පැවරී ඇති බලතල, මූල්‍ය විනයකින් යුතුව පවත්වාගෙන යාම පැවරී ඇති කාර්යභාරයන් වේ.

අමාත්‍යාංශයට අදාළ ගිණුම් කටයුතු සහ සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකිරීමට අමතරව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා මණ්ඩලවල ගිණුම් සුපරීක්ෂණය ද සිදුකරනු ලැබේ.

## අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන සේවාවන් හා වැඩසටහන් ගුණාත්මකව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අවශ්‍ය මූල්‍ය විගණනය, කාර්යසාධන විගණනය, කළමනාකරණ විගණනය, පද්ධති පාලන විගණනය හා අවදානම් සහගත ක්ෂේත්‍ර පාදක කරගත් විගණනය සිදු කිරීම තුළින් ආයතනයේ අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමට මඟ පෙන්වීම සිදු කිරීමයි.

## සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය

### හැඳින්වීම

කාන්තා හා ළමා ක්ෂේත්‍රය තුළ අමාත්‍යාංශ සේවාවන් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සැලසුම්කරණය, මෙහෙයුම්කරණය, පසුවිපරම්කරණය සිදුකිරීම හා අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතාවන් ක්‍රමවත්ව පවත්වාගෙන යාම, ඊ - රාජ්‍ය ප්‍රතිපත්තිය හා ඊට අදාළ සියලුම තාක්ෂණික ප්‍රතිපත්තීන්ට අනුකූලව අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ කටයුතු පවත්වාගෙන යන අංශය වේ.

### ප්‍රධාන කාර්යභාරය

අමාත්‍යාංශයේ සියලු අංශවල/ දෙපාර්තමේන්තුවල/ආයතනවල තොරතුරු ඒකාබද්ධ කර වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, කාන්තා හා ළමා ක්ෂේත්‍රයට අදාළ ජාතික සැලසුම් සම්පාදනය කිරීම හා අවශ්‍ය දායකත්වය ලබා දීම, ක්‍රියාකාරී සැලසුම්වලට අදාළව ප්‍රගති වාර්තාකරණය, ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා දිස්ත්‍රික් සම්බන්ධීකරණ ක්‍රියාවලිය පවත්වාගෙන යාම, අමාත්‍යාංශයට අදාළ සංවර්ධන වැඩසටහන් මෙහෙයුම්කරණය හා ඇගයීම හා සංවර්ධන වැඩසටහන්වලට අදාළ ඉදිරි වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා නව ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම, අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ප්‍රධාන කාර්යභාරයන් වේ.

## පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

### හැඳින්වීම

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් අනාථ, අත්හල, අසරණ හා ගැටුම්වලින් අවතැන් වූ යන සියලු කණ්ඩායම්වල ළමුන්ට සම අවස්ථාවන් ඇති කරලීම සඳහා ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති හා නෛතික විධිවිධාන අනුව කටයුතු කරනු ලබන ජාතික මට්ටමේ ආයතනයයි.

### ප්‍රධාන කාර්යභාරය

ජාතික ප්‍රතිපත්තීන් හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමයින් ද නීතිමය ගැටලුවලට යොමු වූ ළමයින් ද සුවිශේෂී කර ගනිමින් සියලු ළමයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ගනිමින් ඔවුනට සමාන අවස්ථාවන් උදාකර දීම යන මෙහෙවර යටතේ පරිවාස හා ළමාරක්ෂණ සේවය ක්‍රියාත්මක වේ.

පරිවාස විෂය යටතේ ප්‍රධාන වශයෙන් පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු කාර්යයන් සඳහා සම්බන්ධීකරණය හා සහාය වීම, පරිවාස විෂය යටතේ ක්‍රියාත්මක වන විවිධ ආයතන සඳහා අවශ්‍ය අවස්ථාවලදී මඟපෙන්වීම, ජාතික ප්‍රතිපත්ති/ ප්‍රමිතීන් සකස් කිරීම, විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම, ළමුන්ට අදාළ නීති සංශෝධනය හා නව නීති සම්පාදන කටයුතු සඳහා සහාය වීම සිදු කරනු ලැබේ.

ළමාරක්ෂණ විෂය යටතේ ළමා ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවීම, ළමාරක්ෂණය සඳහා වන සමාජ ව්‍යුහයන් ස්ථාපිත කිරීම හා ශක්තිමත් කිරීම, ළමාරක්ෂණය සඳහා දිවයින පුරා ක්‍රියාත්මක රාජ්‍ය නොවන සංවිධාන හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරන ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් හා ප්‍රවර්ධන සහකාර නිලධාරීන් හරහා සිදු කරනු ලැබේ.

## මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

### හැඳින්වීම

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය 1979 වර්ෂයේදී ස්ථාපනය කර ඇති අතර ආයතනයේ ආයතනික අරමුණු, දැක්ම, මෙහෙවර සහ කාර්යයන් නිසි පරිදි නිරූපණය වන ආකාරයෙන් එහි ආයතනික නාමය මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය ලෙස 2020 වර්ෂයේදී සංශෝධනය කරන ලදි.

දරුවකු මව්කුස පිළිසිඳ ගැනීමේ සිට වයස අවුරුදු 5 දක්වා කාලය දරුවාගේ මුල් ළමාවිය අවධිය ලෙස සැලකේ. ඒ අනුව, ශාරීරික, මනෝ සමාජීය සහ ප්‍රජානන සංවර්ධනයෙන් පිරිපුන් ශ්‍රී ලාංකීය මුල් ළමාවිය දරු පරපුරක් බිහිකිරීම හා ජාතික මට්ටමේ කේන්ද්‍රීය ආයතනය ලෙස ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, ඇගයීම හා පසුවිපරම් කිරීම තුළින් ශ්‍රී ලාංකීය මුල් ළමාවිය දරුවන්ගේ සමස්ත සංවර්ධනය සහතික කිරීම සිය මෙහෙවර කරගනිමින් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය කටයුතු කරනු ලැබේ.

### ප්‍රධාන කාර්යභාරය

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති, ව්‍යාපෘති/ වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කේන්ද්‍රීය ආයතනය ලෙස කටයුතු කිරීම, රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය හා ජාලගත කිරීම, මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනයට අදාළ වන පර්යේෂණ සිදු කිරීම, දත්ත රැස්කිරීම සහ වැඩසටහන් සම්පාදනය කිරීම, මුල් ළමාවියේ දරුවන්ගේ සමස්ත සංවර්ධනය සඳහා අදාළ වන පුහුණු වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම හා මුල් ළමාවිය සංවර්ධනයට අදාළ මානව සම්පත් සංවර්ධනය ප්‍රධාන කාර්යභාරයන් ය.

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

### හැඳින්වීම

ළමා අපයෝජන වැළැක්වීම සහ එවැනි අපයෝජනවලට ගොදුරු වූ ළමයින් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිණිස ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කාර්ය සඳහා සහ සියලු ආකාරයේ වූ ළමා අපයෝජනවලට එරෙහි වූ ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය හා නියාමනය කිරීම සඳහා 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත මඟින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවන ලදි.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2025 ජාතික සංවර්ධන ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී මුදල් අමාත්‍යාංශයේ අයවැය දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත ප්‍රාග්ධන වියදම් සහ පුනරාවර්තන වියදම් ලෙස වර්ගීකරණයට ලක් කරන ලදි.

### ප්‍රධාන කාර්යභාරය

ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත ප්‍රකාරව පුළුල් කාර්යභාරයක් පැවරී ඇති ආයතනයකි.

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නෛතික, පරිපාලන හෝ වෙනත් ප්‍රතිසංස්කරණ සංවර්ධනය කිරීම, මහජනතාවගෙන් ළමා අපයෝජනය සම්බන්ධ පැමිණිලි භාර ගැනීම, ළමුන් සම්බන්ධ ළමා අපයෝජන නඩු ක්‍රියාවලිය නියාමනය, නීතිය සමඟ ගැටෙන හා සම්බන්ධ වන ළමයින් සඳහා ආධාර, නියාමනය සහ පසු විපරම් සිදුකිරීම හා ළමා ආරක්ෂක සේවා සහ පහසුකම් සැපයීම සඳහා අවම ප්‍රමිතීන් සංවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම ඊට ඇතුළත් වේ. එමෙන්ම ළමයාගේ උපරිම යහපත සඳහා ළමා අපයෝජන වැළැක්වීමේ හා අපයෝජනයට ගොදුරු වූ ළමයාට ප්‍රතිචාර දැක්වීමේ අරමුණු ඇතිව ජාතික වැඩසටහන් සංවර්ධනය සහ පැවැත්වීම, සියලු ආකාරයේ අපයෝජනවලින් ළමයාගේ ආරක්ෂාව තහවුරු කිරීමට ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රමවේදයන් හා ළමා ආරක්ෂණ දැනුම ප්‍රචලිත කිරීම සඳහා ළමුන්, යෞවනයන්, වෘත්තිකයන් සහ ප්‍රජාව දැනුවත් කිරීම, තොරතුරු සහ අධ්‍යාපනය ලබාදීම හා ළමා ආරක්ෂණය හා ළමා සංවර්ධනය පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ රැස්වීම්, වැඩමුළු, සාකච්ඡා, සහ සංසද ආදිය පැවැත්වීම ද ප්‍රධාන කාර්යයන් අතර වේ.

අධිකාරියේ කාර්යභාරය සිදුකිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නිලධාරීන් අනුයුක්ත කර ඇත. ඔවුන් අධිකාරිය මඟින් යොමු කරන කාර්යයන් හා සෘජුව තමන් වෙත වාර්තා වෙන්නා වූ කාර්යයන් සම්බන්ධයෙන් කටයුතු කරයි.

## ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

### හැඳින්වීම

කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබලගැන්වීම සඳහා ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාවට නංවන ජාතික යාන්ත්‍රණයයි. ශක්තිමත් සංවිධාන ජාලයක් ඇති කරමින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් ඔවුන්ගේ අවශ්‍යතා සාමූහික ක්‍රියාවලියක් හරහා ඉටු කිරීමට ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය කටයුතු කරනු ලබයි.

### ප්‍රධාන කාර්යභාරය

ශ්‍රී ලාංකීය කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් බලගැන්වීම සඳහා සුදුසු වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම මෙන්ම සියලුම වයස් පරාසවල කාන්තාවන්ගේ සුවිශේෂිතා හඳුනාගෙන ඔවුන් උචිත පරිදි රටේ සමස්ත සංවර්ධනයේ කොටස්කරුවන් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රධාන කාර්යභාරයන් අතර වේ.

කාන්තාවන් වීම නිසාම ඔවුන් මුහුණදෙන සමාජීය දුෂ්කරතා මඟ හැරවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, සමාජයේ විශේෂ හේතූන් නිසා විවිධ පීඩාවන්ට මුහුණ දෙන කාන්තාවන් අරඹයා විශේෂ වැඩසටහන් මෙන්ම සමස්ත කාන්තා පරපුරේ දැනුම, කුසලතා සහ ආකල්ප ඉහළ තලයකට නංවාලීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද සිදුකරනු ලබයි. තවද කාන්තාවන්ට එකම සංවිධානයක් තුළ ක්‍රියාත්මක වීම සඳහා (Smooth Functioning) ප්‍රජා මූල මට්ටමේ සිට ජාතික තලය දක්වා කාන්තාවන් සංවිධානගත කිරීම ද ප්‍රධාන කාර්යයන්ය.

## ජාතික කාන්තා කමිටුව

### හැඳින්වීම

1993 මාර්තු 08 දින පිහිටවනු ලැබූ ජාතික කාන්තා කමිටුව මඟින් කාන්තා ප්‍රඥප්තියේ නිර්දේශ ක්‍රියාවට නංවනු ලබයි. කාන්තාවන්ගේ සුභසිද්ධිය, ආරක්ෂාව, රැකවරණය වෙනුවෙන් ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කරනු ලබන ජාතික ආයතනයයි.

### ප්‍රධාන කාර්යභාරය

සමානාත්මතාවය තහවුරු වූ, හිංසනයෙන් තොර, කාන්තාවන්ට හිතකර ශ්‍රී ලාංකික සමාජයක් බිහි කිරීමේ අරමුණින් පිහිටුවන ලද ජාතික කාන්තා කමිටුවේ ප්‍රධාන කාර්යය වන්නේ, ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ප්‍රවර්ධනය කිරීම, සමානාත්මතාවය තහවුරු කිරීම හා පූර්ණ සංවර්ධනයට ඉවහල් වන ප්‍රතිපත්ති හා නීති පද්ධතීන් සකස් කිරීම වේ. මේ සඳහා ජාතික කාන්තා කමිටුව මඟින් නිර්දේශ හා සහාය ලබා දීම, අධීක්ෂණය කර ඇගයීම සිදු කරනු ලබයි. ඒ අනුව ජාතික කාන්තා කමිටුව තුළ පැමිණිලි මධ්‍යස්ථානයක් සහ පැය 24 පුරා අවශ්‍ය සේවා සපයන 1938 කාන්තා උපකාරක දුරකතන සේවාව ක්‍රියාත්මක වේ. එම සේවාව මඟින් නීති උපදෙස් ලබා දීම, උපදේශනය ලබා දීම හා අදාළ ආයතන වෙත පැමිණිලිකරුවන් යොමු කිරීම හා වාර්තා කැඳවීම සිදු කරනු ලබයි. එමෙන්ම, ලැබෙන පැමිණිලි සම්බන්ධව කාලීන පසුවිපරම් සිදු කිරීම ද ජාතික කාන්තා කමිටුවේ ප්‍රධාන කාර්යභාරයකි.

## 1.6 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

| අ.අ | ව්‍යාපෘතියේ/වැඩසටහන් නම | දායක නියෝජිතායතනය | ව්‍යාපෘතියේ මූල්‍ය ඇස්තමේන්තුව රු.මි. | ව්‍යාපෘති කාලසීමාව |
|---|---|---|---|---|
| 1 | ආහාර සුරක්ෂිතතාවය සහ ජීවනෝපාය සංවර්ධන ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය (ADB) | ආසියානු සංවර්ධන බැංකුව | 535.11 | 2022 අගෝස්තු සිට 2026 අගෝස්තු දක්වා |
| 2 | ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීමේ වැඩසටහන | එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල | 10.00 | 2025 ජනවාරි සිට 2025 දෙසැම්බර් දක්වා |
| 3 | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල ව්‍යාපෘතිය | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල | 18.60 | 2025 ජනවාරි සිට 2025 දෙසැම්බර් දක්වා |
| 4 | තිරසර ප්‍රජා පදනම් වූ පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන | සෙමාවුල් ගෝලීය පදනම | අදාළ ප්‍රදායක ආයතනය සෘජුව වියදම දරමින් ක්‍රියාත්මක කරනු ලබයි. | 2023-2027 |
| 5 | කාන්තාවන් ව්‍යවසායකත්වය, නායකත්වය හා ජාලකරණය හරහා ආර්ථික වශයෙන් සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය | JICA (ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය) | අදාළ ප්‍රදායක ආයතනය සෘජුව වියදම දරමින් ක්‍රියාත්මක කරනු ලබයි. | 2023-2025 |

# පරිච්ඡේදය 02

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 නෛතික විධිවිධාන ශක්තිමත් කිරීම

### 1. කාන්තාවන් සවිබලගැන්වීමේ පනත බලාත්මක කිරීම

2024 අංක 37 දරන මෙම පනත පාර්ලිමේන්තුවේ සම්මත වූ අතර මෙම පනත 2024 ජූලි 05 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් ලෙස පළ කරන ලදි. එහි විධිවිධාන අනුව කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව 2025 වර්ෂයේදී පිහිටුවීමට කටයුතු කරන ලදි.



### 2. ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අයවැයකරණය පිළිබඳ පනත සකස් කිරීම

ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අයවැයකරණය පිළිබඳ පනත සකස් කිරීම පිළිබඳව වූ සංකල්ප පත්‍රිකාව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබූ සංශෝධන ඇතුළත් කිරීමෙන් අනතුරුව එකඟතාවය ලබා ගැනීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. තවද, මෙම සංකල්ප පත්‍රිකාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

### 3. ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව ළමුන් සඳහා එක් නීතියක් සකස් කිරීම

ශ්‍රී ලංකාවේ ළමුන්ගේ ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ළමා අයිතිවාසිකම් ප්‍රඥාප්තිය පදනම් කර ගනිමින් කාලීන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි එක් නීතියක් යටතේ සකස් කිරීමට මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

## 2.2 සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

### 2.2.1. සංවර්ධන අංශය

#### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

**1. ශ්‍රී ලංකාවේ ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් කරගත් හිංසනය (SGBV) පිටු දැකීම සඳහා වූ බහු-ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NAP) 2024 –2028**

මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2024.12.20 දින සිට ක්‍රියාත්මක කරමින් පවතී. මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අදාළව 2025-2026 වර්ෂයන් සඳහා ක්‍රියාකාරකම් ප්‍රමුඛතාගත කිරීමේ වැඩසටහනක් රේඛීය අමාත්‍යාංශ සම්බන්ධ කර ගනිමින් 2025 වර්ෂයේ දී පවත්වන ලදි.

එසේම, මෙම බහු-ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා වන වැඩමුළු සියලුම පළාත්වල පවත්වන ලදි. එසේම මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමට ආධාරක කණ්ඩායම් සමඟ සාකච්ඡා කිරීම (Donor Forum) සඳහා මූලික කටයුතු සිදුකර ඇත. එසේම, මෙම සැලැස්මේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා පරිගණකගත ක්‍රමවේදයක් සකස් කර ඇති අතර, ඒ පිළිබඳව පළාත්/දිස්ත්‍රික් නිලධාරීන් දැනුවත් කරන ලදි. ඉදිරියේ දී සියලු අමාත්‍යාංශවල අදාළ නිලධාරීන් සඳහා පුහුණු ලබා දීමට සැලසුම් කර ඇත.

**2. ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ උපායමාර්ගික සැලැස්ම**

ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබලගැන්වීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්මෙහි කෙටුම්පත මේ වන විට සකස් කර අවසන්ව ඇත. එහි අවසාන අදියර වශයෙන් ක්‍රියාකාරී සැලැස්මෙහි වලංගුතාවය තහවුරු කර ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශ වෙත කෙටුම්පත යොමු කර ඇත.

**3. කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම (UNSCR 1325)**

ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ යෝජනා 1325 යටතේ හා ජාත්‍යන්තර බැඳීම්වලට ද අනුකූලව මෙම ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇති අතර 2023 වර්ෂයේ දී කැබිනට් අනුමැතිය සහිතව ජාත්‍යන්තර කාන්තා දින උත්සවයේ දී එළිදක්වන ලදි. එමඟින් ශ්‍රී ලංකාවේ ගැටුම්වලින් පීඩාවට පත් වූ සහ පශ්චාත්-ගැටුම් පසුබිම්වල සිටින කාන්තාවන්ගේ සාමය සහ ආරක්ෂාවත්, කාන්තාවන්ගේ ජීවිත උසස් තලයකට නංවාලීමත්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීමත් කෙරෙහි විශේෂ අවධානය යොමු කරයි.

මේ වන විට ජාතික ක්‍රියාකාරී සැලැස්මේ සියලු නිරීක්ෂණ හා සම්බන්ධීකරණය කිරීම සඳහා වූ ප්‍රධාන නියමු කමිටු රැස්වීම් 5ක් ද අන්තර් ආයතනික සම්බන්ධීකරණ හා තක්සේරු කමිටු රැස්වීම් වාර 3ක් ද පවත්වා ඇත. එමෙන්ම, මධ්‍ය වාර්ෂික ප්‍රගතිය සමාලෝචනය කර සියලු පාර්ශ්වකරුවන්ගේ රැස්වීමක් කැඳවා දැනුවත් කර ඇත. 2025 වර්ෂය අවසාන වන විට 48% ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

**4. 2024 අංක 37 දරන කාන්තාවන් සවිබලගැන්වීමේ පනතෙහි ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම**

මේ වන විට කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට අදාළ සාමාජිකයින් හා විධායක අධ්‍යක්ෂ පත්කර ඇත. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය උත්ශ්‍රේණිගත කිරීමට අදාළ කැබිනට් පත්‍රිකාව කැබිනට් මණ්ඩලය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදුව මහා භාණ්ඩාගාරය ඇතුළු අදාළ අනෙකුත් සියලු පාර්ශ්වයන් සමඟ එක්ව වැඩිදුරටත් අධ්‍යයනය කිරීමට **2025 ජූලි මස 02** දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක **අමප/25/1052/819/011** මගින් දන්වා ඇත.

**5. ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අයවැයකරණය පිළිබඳ පනත සකස් කිරීමට මූලික පසුබිම සැකසීම**

පාර්ලිමේන්තුවෙන් සම්මත වන අයවැය තුළ කාන්තාවන්ට විශේෂිත ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්වන බව තහවුරු කිරීම හා වාර්ෂික අයවැය අධ්‍යනය කර එය හඳුනාගැනීම, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අයවැයකරණය පිළිබඳ පනත සකස් කිරීමේ මූලික අරමුණ වේ. එම සංකල්ප පත්‍රිකාවෙහි සිදු විය යුතු සංශෝධන පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමඟ සාකච්ඡා කර අවසාන සංකල්ප පත්‍රිකාව සකස් කරන ලදි. එමෙන්ම, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අයවැයකරණය පිළිබඳව අනෙකුත් අදාළ අමාත්‍යාංශ ප්‍රධානීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් ද මෙම වර්ෂයේ දී පවත්වන ලදි. මෙම සංකල්ප පත්‍රිකාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

**6. ආයතනික රැකවරණ සහ භාරකාරත්වය යටතේ වන ළමුන් සහ වීදි ළමුන් සඳහා ජීවන වියදම් දීමනාව**

ශ්‍රී ලංකාවේ ආයතනික රැකවරණ සහ භාරකාරත්වය යටතේ වන ළමුන් සහ වීදි ළමුන් සඳහා ජීවන වියදම් දීමනාව වශයෙන් රු.5000.00 ක මුදලක් 2025.01.01 දින සිට ක්‍රියාත්මක වන අවුරුදු 18 සම්පූර්ණ වන තෙක් ලබා දීමේ වැඩසටහන "අර්ථ" නමින් ආරම්භ කරන ලදි. මෙම වැඩසටහන තුළ දරුවාගේ ගිණුම වෙත රු. 2000.00ක් සහ දරුවා වෙනුවෙන් ආයතනය වෙත රු.3000.00ක මුදලක් ලබාදෙනු ලැබේ. 2025 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දරුවන් 6814 දෙනෙකු සඳහා මුදල් බැරකර ඇත. මෙම වැඩසටහන සඵලදායීව පවත්වා ගෙන යාම, ප්‍රගති සමාලෝචනය හා පසුවිපරම් කටයුතු සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ සභාපතිත්වයෙන් ජාතික මට්ටමේ මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කර ඇත.

**7. ආයතනගතව සිට සමාජගත වන අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස පහසුකම් සපයා ගැනීමට මූල්‍යාධාර ලබා දීමේ වැඩසටහන**

නිසි පවුල් පසුබිමක් හෝ වෙනත් විධිමත් ආධාරක පද්ධතියක් නොමැතිව ආයතනගතව සිටීම හේතුවෙන් විවාහ වීම කල්දැමීමට සිදුව ඇති තරුණ තරුණියන්ට ස්ථාවර හා ආරක්ෂිත නිවසක් තනා දීමට රුපියල් මිලියනයක මූල්‍යාධාර ලබා දීම මෙම වර්ෂය තුළ ආරම්භ කරන ලදි. මේ සඳහා 2025 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව යටතේ රු.මි.1000.00ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර ඉඩමක් හිමි ප්‍රතිලාභීන් හඳුනාගැනීම ගැටලු සහගත වූ අතර, වසර අවසාන වූ විට ප්‍රතිලාභීන් 07 දෙනෙකු සඳහා ප්‍රතිලාභ ලබා දීමට සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදි.

**8. ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව ළමුන් සඳහා සංයුක්ත පනතක් සකස් කිරීම**

ශ්‍රී ලංකාවේ ළමුන්ගේ ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ළමා අයිතිවාසිකම් ප්‍රඥාප්තිය පාදක කර ගනිමින් කාලීන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි එක් නීතියක් සකස් කිරීම මෙහි අරමුණ වේ. මේ වනවිට ළමුන්ට අදාළ අනෙකුත් අණපනත් අධ්‍යයන කොට සංකල්ප පත්‍රිකාව සකස් කර ඊට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. එසේම, නීති කෙටුම්පත් සම්පාදක

විසින් මූලික කෙටුම්පත සකස් කර ඇත. එකී කෙටුම්පත පිළිබඳව නැවත වතාවක් අදාළ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කර ලබා ගන්නා ලද යෝජනා සංයුක්ත පනතට ඇතුළත් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.

**9. දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම**

ළමයින්ට හා කාන්තාවන්ට සේවා සපයන සියලුම පාර්ශ්වකරුවන් ඒකාබද්ධ කොට, ගැටලු සාකච්ඡා කිරීමට කමිටු රැස්වීම් කාර්තුමය වශයෙන් පැවැත්වීම සඳහා දිස්ත්‍රික්ක 25 සඳහා අවශ්‍ය රු.මි. 1.07 ක ප්‍රතිපාදන 2025 වර්ෂයේ නිදහස් කරනු ලැබීය.

**10. කාන්තාවන්ට හා ගැහැනු ළමුන්ට එරෙහිව ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය (SGBV) වැළැක්වීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සංසද පිහිටුවීම**

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් කරගත් හිංසනය වැළැක්වීම, ඊට ප්‍රතිචාර දැක්වීම, දත්ත එක්රැස් කිරීම හා උද්දේශනය කිරීම, සම්බන්ධීකරණය කිරීම හා ශක්තිමත් කිරීමේ අරමුණු ඇතිව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සංසද පිහිටු වීම 2025 වර්ෂයේ ද තවදුරටත් සිදු කරන ලදි. වසර අවසන් වන විට ප්‍රාදේශීය මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් සංසද 45ක් පිහිටුවා ඇත.

**11. අඩු වයස් ගැබ් ගැනීම් වැළැක්වීමේ වැඩසටහන**

වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ අඩු වයස් ගැබ් ගැනීම් වාර්තා වීම ඉහල යාම හේතුවෙන් පාසල් ළමුන් ඇතුළු විවිධ ඉලක්ක කණ්ඩායම් වෙනුවෙන් අඩු වයස් ගැබ් ගැනීම් වැළැක්වීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික්ක 12ක දේශීය හා විදේශීය (save the children) ප්‍රතිපාදන රු.මි. 1.255 මුදලක් යොදා ගනිමින් පවත්වන ලදි. එසේ වැඩසටහන් පවත්වන ලද දිස්ත්‍රික්ක වන්නේ කළුතර, මොනරාගල, හම්බන්තොට, කෑගල්ල, ත්‍රිකුණාමලය, අම්පාර, පුත්තලම, කිලිනොච්චිය, කුරුණෑගල, මඩකලපුව, අනුරාධපුර හා රත්නපුර යන දිස්ත්‍රික්ක වේ.

**12. මාධ්‍ය ප්‍රචාරණය**

කාන්තාවන් සහ දරුවන් උදෙසා ජාත්‍යන්තර වශයෙන් වෙන්ව ඇති දිනයන්හී දී ඒ පිළිබඳව සමාජය දැනුවත් කිරීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් ප්‍රවෘත්ති, සම්මුඛ සාකච්ඡා, පුවත්පත් අතිරේක ආදිය හරහා ප්‍රචාරණ කටයුතු සිදුකර ඇත. කාන්තාවන් සවිබලගැන්වීම සහ ඔවුන් සුරැකීම උදෙසා අමාත්‍යාංශය විසින් දියත් කරනු ලබන වැඩසටහන්, ව්‍යාපෘති, ක්‍රියාකාරකම් පිළිබඳවත්, කාන්තාවන්ට හා දරුවන්ට හිතකර අයුරින් සදාචාරාත්මක ලෙස මාධ්‍ය හැසිරවීම උදෙසා අමාත්‍යාංශය විසින් දියත් කරනු ලබන විවිධ වැඩසටහන් පිළිබඳවත් සමාජය සංවේදී කිරීම සඳහා මාධ්‍යන්හි දායකත්වය ලබාගැනීම සිදුකෙරේ.

**13. වෙනත් අමාත්‍යාංශ වෙත වාර්තා/ තොරතුරු ලබාදීම හා ඊට අදාළ සම්බන්ධීකරණ කටයුතු**

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ (UNGA) 80 වැනි සැසිවාරය සැප්තැම්බර් මාසයේ පැවැත්වීමට නියමිත ව තිබූ බැවින් එහි ඉහළ මට්ටමේ මහා විවාදයට (High Level General Debate) අවශ්‍ය තොරතුරු විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත සපයන ලදි. තවද, 80 වන මහා විවාදය සඳහා ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාගේ ප්‍රකාශය (Country Statement) ඉදිරිපත් කිරීමට නියමිත වූ බැවින් ඊට අවශ්‍ය කරුණු සහ මෙම සැසිවාරයේ සාකච්ඡා සඳහා ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමට අවශ්‍ය තොරතුරු විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය වෙත යොමු කරන ලදි.

කාන්තාවන් පිළිබඳ සිව්වන ලෝක සමුළුවේ තිස් වැනි සංවත්සරය වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලයේ ඉහළ මට්ටමේ රැස්වීමක් නිව්යෝක් නුවර පැවැත්වූ බැවින් ඊට අවශ්‍ය තොරතුරු විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය වෙත සපයන ලදි.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය හරහා ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ කමිටුව ඉදිරි සැසිවාරවලදී සලකා බැලිය යුතු ශ්‍රී ලංකාවේ මූලික වාර්තාවට අදාළ ගැටලු ලැයිස්තුව (List of Issues) අදාළ තොරතුරු විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලබා දෙන ලදි.

**14. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා කාන්තා අයිතිවාසිකම් පිළිබඳ වැඩසටහන - එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල් (UNFPA) ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කරන වැඩසටහන්**

ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය හිංසනය වැළැක්වීමට හා වින්දිතයන් වෙත සේවා සැපයීම සඳහා එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල මඟින් 2025 වසර සඳහා සඳහා රු.මි. 10.00ක් මෙම අමාත්‍යාංශය වෙත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී ඇත. වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය හා ජාතික කාන්තා කමිටුව සඳහා ද ප්‍රතිපාදන වෙන් කරන ලද අතර සංවර්ධන අංශය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් 95%ක ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

## 2.2.2. සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය

## ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

### 1. සැලසුම්කරණය

සැලසුම්කරණය යටතේ අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, දිස්ත්‍රික් ක්‍රියාකාරී සැලසුම්, ආයතනික ප්‍රතිඵල රාමුව සඳහා වන සැලැස්ම ඇතුළු කාන්තා හා ළමා ක්ෂේත්‍රයට අදාළ වෙනත් සැලසුම් සකස් කිරීමේ තාක්ෂණික දායකත්වය ලබා දීම සිදු කර ඇත. තවද, රජයේ නව ප්‍රතිපත්ති ප්‍රකාශයට අදාළව මෙම අමාත්‍යාංශයට පැවරී ඇති ප්‍රමුඛතා ක්ෂේත්‍ර 43ට අනුගත වෙමින් 2025 ක්‍රියාකාරී සැලැස්මක් හා 2025-2029 පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්මක් ද සකස් කර ඇත. ඊට අමතරව, ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති මෙන්ම නිර්දේශ අනුව මෙම අමාත්‍යාංශ විෂය පථය යටතේ විවිධ ආයතන/ දෙපාර්තමේන්තු හා වෙනත් අමාත්‍යාංශ මඟින් සකස් කෙරෙන සැලසුම්, ප්‍රතිපත්ති හා වෙනත් කාලීන වාර්තා සඳහා තාක්ෂණික සම්පත්දායකත්වය ලබා දී ඇත.

### 2. මෙහෙයුම්කරණය

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අදාළ කාර්තු ප්‍රගතිය වාර්තා කිරීම, දිස්ත්‍රික් සැලසුම් ප්‍රකාරව ප්‍රගති වාර්තාකරණය, ප්‍රගති වාර්තාව හා කාර්යසාධන වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීම. අමාත්‍යාංශයේ සියලු සංවර්ධන වැඩසටහන්වලට අදාළ මාසික, කාර්තු හා වාර්ෂික ප්‍රගති වාර්තාකරණය හා ප්‍රගති සමාලෝචන සාකච්ඡා පැවැත්වීම සිදු කර ඇත. 2025 අයවැය යෝජනා සම්බන්ධ මාසික ප්‍රගති වාර්තාකරණය මෙන්ම ජනාධිපති කාර්යාලය මඟින් ඉල්ලුම් කරන විශේෂ ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම සිදුකර ඇත.

එසේම, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ කාර්තු පාදක ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන රැස්වීම් 02ක් පවත්වා නිර්දේශ ලබා දී ඇත. මෙම අමාත්‍යාංශයට අදාළව ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්ගේ කාර්යයන් හා ප්‍රගතිය පිළිබඳ ප්‍රගති සමාලෝචන සාකච්ඡාවන් 02ක් පවත්වා නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ ලබා දී ඇත. ඉන් එක් සාකච්ඡාවක් Zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වූ අතර, අනෙක් සාකච්ඡාව සෙත්සිරිපාය පරිශ්‍රයට කැඳවනු ලැබූ දිස්ත්‍රික් නිලධාරීන් 165කගේ සහභාගීත්වයෙන් පැවැත්වුණි.
තවද, දිත්වා ආපදා තත්ත්වය හේතුවෙන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම පසුවිපරම්කරණය වෙනුවෙන් නිලධාරීන් 500කගේ සහභාගීත්වයෙන් zoom මාර්ගයෙන් සාකච්ඡාවක් පවත්වන ලදි.

### 3. පසුවිපරම්කරණය

තරුණ කාන්තා ව්‍යවසායකයින් දිරි ගැන්වීමේ අරමුණින් සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කෙරුණ අයවැය යෝජනාවක් මඟින් තරුණ ව්‍යවසායක කාන්තාවන් වෙත අමාත්‍යාංශය හරහා ව්‍යාපෘති ණය ලබා දී ඇත. මාතර දිස්ත්‍රික්කයේ තිහගොඩ, කිරින්ද - පුහුල්වැල්ල හා හක්මණ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03 ක් තෝරා ගෙන එකී ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ගේ ආදායම් වර්ධන ව්‍යාපෘති නිරීක්ෂණයට ලක්කර නිගමන හා නිර්දේශ සහිත වාර්තා ඉදිරිපත් කර තිබේ.
පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ළමා විෂයට අදාළ ව්‍යාපෘති කිහිපයක පසුවිපරම් ක්ෂේත්‍ර නිරීක්ෂණයක් සිදු කර වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

### 4. ඩිජිටල්කරණය හා තොරතුරු තාක්ෂණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම

පුරවැසියන්ට විනිවිද පෙනෙන සහ කාර්යක්ෂම සේවාවන් සපයන ප්‍රතිචාරාත්මක රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම සඳහා රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය රජයේ ඉහළම ප්‍රමුඛතාවය වී ඇති අතර කාන්තා සහ ළමා කටයුතු ඩිජිටල්කරණය වෙනුවෙන් 2025 වසර සඳහා රු.මි. 30.00ක ප්‍රතිපාදන වෙන් කර ඇත. ඒ අනුව, දත්ත රැස් කිරීම, දත්ත බෙදා හැරීම හා විශ්ලේෂණය කිරීමේ ක්‍රමෝපායන් පිළිබඳ තොරතුරු රැස් කිරීමක් කරන ලද අතර, එහි යෝජනා හා අදහස් පදනම් කර ගනිමින් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය හා තාක්ෂණික ආයතන සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වා ඇත. කාන්තා සහ ළමා විෂය ක්ෂේත්‍රයේ සංවිධිත දත්ත පද්ධතියක් හා දත්ත හා වාර්තා ලබා ගැනීමේ පද්ධතියක් සකස් කිරීමට අපේක්ෂා කර ඇත.

එසේම, අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය, YouTube චැනලය හා Facebook පිටුව පවත්වා ගෙන යාමේ කටයුතු මෙම අංශයට පැවරී ඇති අතර, ආයතන මඟින් ලබා දෙන තොරතුරු මත අදාළ මාධ්‍ය යාවත්කාලීන කිරීම සිදු කරනු ලබයි. අමාත්‍යාංශයේ ප්‍රති වෛරස මෘදුකාංග සැපයීම, ලංකා ඊ - රාජ්‍ය ජාල ව්‍යාපෘතිය යටතේ අන්තර්ජාල කටයුතු හා පරිගණක ජාලකරණයට අදාළ කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාමද සිදු කර ඇත.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය ක්ෂේත්‍රයේ නිලධාරී දැනුම යාවත්කාලීන කිරීම අරමුණු කර ගනිමින් අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩමුළු පවත්වන ලදි. ප්‍රධාන වශයෙන් මෙහිදී අමාත්‍යාංශයේ සංවර්ධන කාර්යයන්හි නිරත ආයතනවල නිලධාරීන් සඳහා අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය, නිල Facebook ගිණුම, LGN and LAN, ඊ-වාණිජ, photoshop, MS Access (Advance) සහ සයිබර් ආරක්ෂාව පිළිබඳව සිදු කළ පරිගණක පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 11ක් පමණ වන අතර ඒ සඳහා සහභාගි වූ නිලධාරීන් ගණන 619ක් පමණ වේ.

එසේම, කාන්තා සහ ළමා කටයුතු ඩිජිටල්කරණය කිරීමේ වර්තමාන විෂය පථයට ප්‍රවිෂ්ට වීමේ අරමුණින් නව පුහුණුවීම් හරහා කාර්ය මණ්ඩලයට වැඩි ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට ඉඩ සලසා දෙන ලදි. එමඟින් "රාජ්‍ය සේවකයන් සඳහා අත්‍යවශ්‍ය තොරතුරු සන්නිවේදන තාක්ෂණය හඳුන්වා දීම" සහ "නවීන තාක්ෂණ භාවිතයෙන් රාජ්‍ය සේවකයින්ගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම" යන පුහුණු වැඩසටහන් මෙන්ම සයිබර් ආරක්ෂාව, දත්ත ආරක්ෂණ පනත, ඊ රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳව ද අමාත්‍යාංශයේ නිලධාරීන් බහුතරයක් ආවරණය වන සේ පුහුණුවීම් ලබා දී ඇත.

අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ උපාංග හා මෙවලම් සම්බන්ධ තොග ලේඛනයක් සකස් කිරීම සඳහා සහ QR කේතයක් යටතේ අදාළ තොරතුරු ගබඩා කිරීමේ ක්‍රමවේදයක් ද ආරම්භ කර ඇත.

### 5. දැනුවත් කිරීමේ වැඩසටහන්

ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දැක්වීමේ ආපදා සූදානම ශක්තිමත් කිරීම සඳහා මාතර දිස්ත්‍රික්කයට අනුයුක්තව සේවයේ නිරත වන කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා වාර්තා ඉදිරිපත් කර තිබේ. ඒ සඳහා සහභාගී වූ නිලධාරීන් ගණන 100ක් පමණ වේ.

මෙහි දෙවන වැඩසටහන කුරුණෑගල දිස්ත්‍රික්කයේ කාන්තා සහ ළමා විෂයට අදාළ නිලධාරීන් සඳහා පවත්වන ලද අතර, ඒ සඳහා නිලධාරීන් 150ක් සම්බන්ධ වී ඇත.

### 6. ව්‍යාපෘති සම්බන්ධීකරණය

ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සංවර්ධන ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය මෙම අමාත්‍යාංශය වෙනුවෙන් සම්බන්ධීකරණය සිදු කරනුයේ සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය මඟින් වන අතර, ඒ යටතේ ප්‍රගති වාර්තාකරණය, මෙහෙයුම් සාකච්ඡා මෙන්ම ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා ප්‍රදායක ආයතන මට්ටමේ සාකච්ඡා නියෝජනය, අදාළ උපදෙස් හා නිර්දේශ ලබා දීම සිදු කර ඇත. මෙම ව්‍යාපෘතිය 2022 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2026 වර්ෂයේ අගෝස්තු මස දක්වා ක්‍රියාත්මකයි. කාන්තා හා ළමා සංවර්ධනය උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රු.මි. 535.11ක ප්‍රතිපාදන වෙන්ව පවතී. එසේම, සංවර්ධන අංශය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය හා ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් වැඩසටහන් ක්‍රියාවට නංවනු ලබයි.

අනෙකුත් විදේශ ආධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය හා අදාළ කාර්යයන්, ළමා හා කාන්තා සංවර්ධන විෂය සම්බන්ධ වෙනත් අමාත්‍යාංශ හා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධීකරණය වෙමින් සිදු කෙරේ.

### 7. අභ්‍යන්තර කටයුතු ඒකකය පවත්වා ගෙන යාම

රාජ්‍ය නිලධාරීන්ගේ සුපිළිපන්නභාවය තහවුරු කරමින් අල්ලස් හා දූෂණයෙන් තොර රාජ්‍ය සේවාවක් ශ්‍රී ලංකාව තුළ නිර්මාණය කිරීමේ අත්‍යාවශ්‍ය වැදගත්කම කෙරෙහි අවධානය යොමු කරමින්, ඒ අරභයා පවතින රජයේ ප්‍රතිපත්ති කෙරෙහි අනුගත වෙමින්, අමාත්‍යාංශය තුළ අභ්‍යන්තර කටයුතු ඒකකයක් (IAU) පිහිටුවන ලද අතර, එහි කාර්යයන් අඛණ්ඩව අතිශයින් ප්‍රමුඛව මෙන්ම විනිවිදභාවයෙන් යුතුව සිදු කර ඇත. අමාත්‍යාංශය වෙනුවෙන් අනෙකුත් අංශ/ දෙපාර්තමේන්තු සහ ආයතන සමඟ ඒකාබද්ධව අමාත්‍යාංශයේ අභ්‍යන්තර කටයුතු ඒකකය පවත්වා ගෙන යාම හා එහි මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ වගකීම මෙම අංශයට පැවරී ඇත. ඒ යටතේ දැනුවත් කිරීමේ හා උපදෙස් ලබා දීමේ සාකච්ඡා කිහිපයක් සිදුකර ඇත. එමඟින් දැනුවත් කිරීමේ අත්පත්‍රිකා, පෝස්ටර් හා ස්ටිකර් බෙදා හැරීම තුළින් අනෙකුත් නිලධාරීන් දැනුවත් කිරීම සිදු කර ඇත.

### 8. වැඩසටහන් ඇගයීම

ශ්‍රී ලංකාවේ ජාතික ඇගයුම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සියලුම රාජ්‍ය ආයතනවල වගකීම හා කාර්යභාරය වේ. ඒ පිළිබඳව සැලකිල්ලට ගෙන මෙම අංශය මඟින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ක්‍රියාත්මක පාසල් ළමා ආරක්ෂක කමිටු වැඩසටහන පිළිබඳ ඇගයීම් සිදු කිරීමට අවශ්‍ය මූලික කටයුතු ඉටු කර ඇත. මේ සඳහා රුපියල් මිලියන 3.00ක ප්‍රතිපාදන ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය යටතේ අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.

## 2.2.3. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

#### ගර්භණී හා කිරිදෙන මව්වරුන් වෙනුවෙන් ක්‍රියාත්මක වැඩසටහන් / ප්‍රතිලාභ

**1. ගර්භණී හා කිරිදෙන මව්වරුන් සඳහා රු.45,000.00ක පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන**

පවුලේ ආදායම එම පවුලේ ඇස්තමේන්තුගත මධ්‍යයන මාසික වියදමට වඩා අඩු පවුල්වල මව්වරුන් හෝ පෝෂණ ඌණතා හා වෙනත් සෞඛ්‍ය හේතු සහිත මව්වරු සඳහා ගර්භණී සමයේ අවසන් මාස 06 සහ කිරිදෙන සමයේ පලමු මාස 04 සඳහා අවශ්‍ය පෝෂණීය ආහාර ද්‍රව්‍ය ලබාගැනීම වෙනුවෙන් රු.45,000.00 ක් වටිනා වවුචර් පත් නිකුත් කෙරේ. 2025 වර්ෂයේ දී දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි මෙම වැඩසටහන වෙනුවෙන් රු.මි. 7,500ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කර ඇත. එහි භෞතික ඉලක්කය මව්වරුන් 200,000 කි. 2025 වර්ෂය තුළ මව්වරුන් 171,647 සඳහා දරන ලද වියදම රු.මි. 7,239.62 ක් වේ.

**2. එක් වරක් පමණක් ලබාදෙන රු.5000.00ක පෝෂණීය ආහාර මල්ලක් ලබාදීමේ වැඩසටහන**

2025 අයවැය යෝජනාවකට අනුව 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා එක්ව කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය මඟින් උත්සව සමය පදනම් කරගනිමින් රජයේ මාතෘ සායනවල ලියාපදිංචි සියලුම ගැබිණි මව්වරුන් සහ කිරිදෙන මව්වරුන් (දරුවාට මාස 4 වන තෙක්) සඳහා එක් වරක් පමණක් ලබාදෙන රු.5000.00ක පෝෂණීය ආහාර මල්ලක් සඳහා වන දීමනාව ලබාදීමේ වැඩසටහන දෙසැම්බර් මස තුළ ක්‍රියාත්මක කරන ලදි.

මෙම වැඩසටහන වෙනුවෙන් ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සහයෝගය ලබා ගනිමින් දිවයින පුරා පිහිටි මාතෘ සායනවල 2025 නොවැම්බර් 30 දක්වා ලියාපදිංචි සියලුම ගර්භණී හා කිරිදෙන මව්වරුන් (දරුවාට මාස 4 වන තෙක්) තෝරා ගැනීම සිදුකර ඇත. ඒ අනුව, ගර්භණී හා කිරිදෙන මව්වරුන් 240,000ක් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.මි. 1,500.00ක් වෙන් කර තිබූ අතර 2025.12.31 දින වනවිට ගර්භණී හා කිරිදෙන මව්වරුන් 179,612 ක් සඳහා වියදම රු.මි. 898.06 කි.

#### පෙර පාසල් ගුරුවරුන් වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන් / ප්‍රතිලාභ

**3. පෙර පාසල් ගුරුවරියන් සඳහා මාසික දීමනාවක් ලබාදීමේ වැඩසටහන**

පෙර පාසල් ගුරුවරුන්ගේ සේවය ඇගයීම හා ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය ඉහල නැංවීම අරමුණු කර ගෙන පෙර පාසල් ගුරුවරුන්ට මාසික දීමනාවක් ලබාදීමේ ගුරු අභිමානී වැඩසටහන 2025 වර්ෂයේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක විය. 2025 ජනවාරි මස සිට මැයි 31දින දක්වා ලබාදුන් රු.5000/- ක දීමනාව 2025 ජුනි මස සිට රු.6000/- දක්වා ඉහල නංවා ඇත. මෙම වැඩසටහන වෙනුවෙන් වාර්ෂිකව වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.1050.00 ක් වන අතර වාර්ෂික ඉලක්කය ප්‍රතිලාභී ගුරුවරු 15,833 කි. 2025 වර්ෂයේදී ප්‍රතිලාභී ගුරුවරු15,833 වෙනුවෙන් දරන ලද මුළු වියදම රු.මි. 1,000.09 ක් වේ.

### 4. පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා ආයතන නියාමනය හා අධීක්ෂණය

පෙර පාසල් ගුරුවරුන්ගේ සේවාවේ ගුණාත්මක තත්ත්වය පවත්වා ගැනීම, මුල් ළමාවිය සංවර්ධනය, අධ්‍යාපනය සම්බන්ධයෙන් මනා දැනුමෙන්, කුසලතාවයෙන් හා යහපත් ආකල්ප වලින් යුතු පෙර පාසල් ගුරුවරුන් බිහිකිරීමේ අරමුණ මත පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා ආයතන නියාමනය හා අධීක්ෂණ කටයුතු සිදුකරනු ලබයි.

මෙය මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ මූලිකත්වයෙන් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සහභාගීත්වයෙන් සිදුකරනු ලබන අතර පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා ආයතන ලියාපදිංචි කිරීම සඳහා 2025 වර්ෂයේ නවක අයදුම්පත් කැඳවීම් සිදු කරන ලදි. මේ සඳහා දිවයිනම ආවරණය වන පරිදි අයදුම්පත් 110 ප්‍රමාණයක් ලැබී ඇති අතර එම ආයතන සම්බන්ධව සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂණ සහ සම්මුඛ පරීක්ෂණ තුළින් තෝරාගත් නව ලියාපදිංචිය සඳහා සුදුසුකම්ලාභී ගුරු පුහුණු ඩිප්ලෝමා ආයතන සංඛ්‍යාව 75කි.

**පෙර පාසල් දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්/ප්‍රතිලාභ**

### 5. පෙර පාසල් දරුවන් /මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා උදෑසන ආහාරවේලක් ලබාදීමේ වැඩසටහන

පෙර පාසල්ගත අඩුබර සහිත දරුවන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නංවාලීමේ අරමුණ මත 2025 වර්ෂයේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි වතු සහ වතු නොවන ක්ෂේත්‍ර තුළ ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන වෙනුවෙන් එක් දරුවකු වෙනුවෙන් දිනකට රු. 100.00ක් වෙන්කළ අතර වර්ෂය සඳහා වෙන්කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.3,200.00ක් වේ. වාර්ෂික ඉලක්කගත පෙර පාසල් දරුවන් ප්‍රමාණය 155,000 කි. 2025 වර්ෂය තුළ වතු නොවන සහ වතු පෙර පාසල් 7,835 ක් තුළ පෙර පාසල් දරුවන් 151,872 ක් සඳහා දරන ලද මුළු වියදම රු.මි. 2,526.86 ක් වේ.

**ක්‍රියාත්මක කරන ලද වෙනත් වැඩසටහන්**

### 6. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව

ජාතික මට්ටමේ සැලසුම් සම්පාදනයේදී, ක්‍රියාත්මක කිරීමේදී සහ මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ කාර්යයන්වලදී ජාතික මට්ටමේ සිට බිම් මට්ටම දක්වා බහු ආංශික සහයෝගීතාවය සහතික කිරීම හා මුල් ළමාවිය සංවර්ධනය හා ජාතික මට්ටමේ තීන්දු තීරණ ගැනීම මෙම කමිටුවෙහි අරමුණ වේ. 2025 වර්ෂය තුළ කමිටු වාර 3 ක් පවත්වා ඇති අතර දරන ලද මුළු වියදම රු.මි. 0.18 වේ.

### 7. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2018) ක්‍රියාත්මක කිරීම සඳහා වන පස් අවුරුදු බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2018) ක්‍රියාත්මක කිරීම සඳහා වන සියලු පාර්ශ්ව ආයතන සම්බන්ධ කර ගනිමින් සකස් කළ පස් අවුරුදු බහු ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2025 -2029) සඳහා 2025 ඔක්තෝබර් මස කැබිනට් අනුමැතිය හිමිවී ඇත.

**8. මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම්**

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව ජාතික ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම, ජාතික/ පළාත්/ ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමේ ක්‍රියාත්මක වැඩසටහන්හි සාර්ථකත්වය පසු විපරම් කිරීම සහ නිලධාරීන්ගේ රාජකාරී කටයුතු තුළ දී ඇතිවන ගැටලු හඳුනාගැනීම හා ඒවාට විසඳුම් යෝජනා කිරීම යන අරමුණු මත පදනම් වෙමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව, 2025 වර්ෂය අවසානයේ කාර්තුමය රැස්වීම් වාර 3 ක් පවත්වා ඇත.

**9. "සෙනෙහෙ තටාක" නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය වැඩසටහන ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන**

දෙමාපියන් හා රැකබලාගන්නන්ගේ මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය හා සම්බන්ධ දැනුවත්භාවය ඉහළ නැංවීම තුළින් දරුවාගේ සමස්ත සංවර්ධනය තහවුරු කිරීම අරමුණු කරගනිමින් "සෙනෙහෙ තටාක" නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන වැඩසටහන ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන UNICEF ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික්ක 25 ආවරණය කරමින් ක්‍රියාත්මක කරන ලදි.

**10. යහපත් මාපියභාවය හා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දෙමාපියන්, පෙර පාසල් ගුරුවරියන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන**

මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය සම්බන්ධව දෙමාපියන් හා රැකබලාගන්නන්ගේ දැනුවත්භාවය ඉහල නැංවීම හා ආකල්ප සංවර්ධනය තුළින් ප්‍රතිචාරාත්මක දෙමාපියකු/ රැකබලාගන්නකු බවට පත් කිරීමේ අරමුණින් මෙම වැඩසටහන දිස්ත්‍රික් 25ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරන ලදි. මේ සඳහා රු.මි.5.37ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කර තිබූ අතර, 2025 වර්ෂයේ දී රු.මි. 5.06ක වියදම් දරා ඇත.

**11. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතිය**

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය සම්බන්ධිත ගුණාත්මක සේවාවන් ලබා ගැනීමේ අවශ්‍යතාව හා වැදගත්කම පිළිබඳ පොදු ජනතාව තුළ දැනුවත්බව ඇති කිරීමේ ප්‍රධාන අරමුණින් යුතුව සෑම වර්ෂයකම ජූලි මස 14 දින සිට 20 දින දක්වා මුල් ළමාවිය විෂය සම්බන්ධයෙන් වගකිවයුතු සියලු පාර්ශවයන් ඒකරාශි කර ගනිමින්, මුල් ළමාවිය දරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය හා සංවර්ධනය ඉලක්ක කරගත් වැඩසටහන් ජාතික, පළාත්, දිස්ත්‍රික්ක සහ ග්‍රාමීය මට්ටමින් පැවැත්වීම සිදු කරයි. 2025 වර්ෂයේ මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය පිළිබඳ ජාතික සතිය සැමරීම" **පුංචි අපට ලොව දිනන්න - සෙල්ලමටත් ඉඩක් දෙන්න** " තේමාව ඔස්සේ වැඩසටහන් 7ක් ක්‍රියාත්මක විය. ඒ යටතේ,

| අ.අ | ප්‍රතිලාභීන් | වැඩසටහන |
|---|---|---|
| 1 | මුල් ළමාවිය සංවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කරන සියලු කණ්ඩායම් | දැනුවත්භාවය ඉහළ නැංවීම හා සෙල්ලම් පාදක මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ආකල්ප සංවර්ධනය කිරීම |
| 2 | මුල් ළමාවිය සංවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කරන සියලු කණ්ඩායම් | මුල් ළමාවිය ග්‍රාමීය සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකයින් දැනුවත් කිරීම හා බලගැන්වීම සඳහා වැඩසටහන |

| | | |
|---|---|---|
| 3 | තරුණ කණ්ඩායම් සහ නව විවාපත් කණ්ඩායම් | ගැබිණි මවුවරුන් දැනුවත් කිරීමේ සහ රසවින්දනාත්මක ජාතික වැඩසටහන |
| 4 | ප්‍රතිපත්ති සම්පත්දායකයින් | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික කමිටුව කැඳවන අවස්ථාවට සමගාමී වැඩසටහන |
| 5 | දෙමාපියන්, භාරකරුවන් හා ප්‍රජාව | යහපත් මාපියභාවය හා මුල් ළමාවිය සංවර්ධනය |
| 6 | පෙර පාසල් ළමුන් | මුල් ළමාවියේ දරුවන් සඳහා ක්‍රියාකාරකම් පාදක පොකුරු වැඩසටහන |
| 7 | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසල් ගුරුවරියන්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකාවන්, ළමා නිවාස පාලිකාවන් | සෙල්ලම් පාදක ඉගැන්වීම පිළිබඳව දැනුවත් කිරීමේ සාකච්ඡාමය වෙබිනා වැඩසටහන |

## 12. මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන

2014 වර්ෂයේ සිට සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අනුයුක්තව සේවයේ නියුතු මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරි කටයුතු ඉතා කාර්යක්ෂමව සහ කඩිනමින් ඉටු කරගැනීම සහ දැනුම යාවත්කාලීන කිරීමේ අරමුණින් මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් 93 දෙනෙකු වෙනුවෙන් 2025 වර්ෂයේ දී පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

## 13. ළමා නිවාස සහ දරුවන් භාරගැනීමේ මධ්‍යස්ථානවල සංවර්ධනය සඳහා ළමා මිතුරු පරිසරයක් ඇති කිරීමේ වැඩසටහන

වැලිකඩ බන්ධනාගාරයේ රැකවරණ මධ්‍යස්ථානය තුළ සිටින මුල් ළමාවිය දරුවන්ගේ සංවර්ධන අවස්ථාවන් පුළුල් කෙරෙන සහ ධනාත්මක උත්තේජන සපයන ආකාරයේ භෞතික පරිසරයක් නිර්මාණය කිරීම, ළමුන් රැකබලාගන්නා සේවක පිරිසට මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ මූලික සංකල්ප පිළිබඳ දැනුම හා දරුවන් රැකබලා ගැනීමේ යහපත් ක්‍රමවේද සම්බන්ධ පුහුණුව ලබාදීම, භෞතික පහසුකම් පුළුල් කිරීම සහ මානව සම්පත සංවර්ධනය තුළින් රැකවරණය හා ආකල්ප සංවර්ධනය ලබන දරුවන්ගේ සමස්ත ගුණාත්මක සංවර්ධනය ළඟා කරවීමේ මූලික අරමුණ පදනම් කරගනිමින් බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. මේ සඳහා රු.මි. 3.02ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කර ඇති අතර 2025 වර්ෂය තුළ වියදම රු.මි. 2.45 කි.

## 14. හදිසි ආපදා අවස්ථාවන්හිදී මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ කටයුතු

පුළුල් හා සමෝධානිත මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන සේවා පද්ධතියක මනා සහාය ලබමින් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සෑම විටම සුරක්ෂිත රැකවරණයකින් යුතු හිතකර පරිසරයක් තුළ ශ්‍රී ලංකාවේ මුල් ළමාවියේ වෙසෙන සියලුම ළමයින්ගේ දිවි පැවැත්ම, වර්ධනය සහ සංවර්ධනය ඇති කිරීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

2025 වර්ෂය තුළ දිට්වා සුළි කුණාටු තත්ත්වය හේතුවෙන් ඇති වූ හදිසි ආපදා අවස්ථාව වෙනුවෙන් පීඩාවට පත්වූ දරුවන්ගේ මනෝ-සමාජීය යහපැවැත්ම ඉහල නැංවීම සඳහා මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්, මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසල් ගුරුවරුන් හා එක්ව ක්‍රියාකාරකම් පාදක කරගනිමින් වැඩසටහන් සුරක්ෂිත මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක කරන ලදි.

**15. ලෝක ළමා දින වැඩසටහන**

ලෝක ළමා දිනය වෙනුවෙන් පවත්වනු ලබන වැඩසටහන් මාලාවට සමගාමීව ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා පෙර පාසල් ගුරු භූමිකාව යන මාතෘකාව යටතේ දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි පෙර පාසල් ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව, 2025.12.31 වනවිට වියදම රු.මි. 1.55 කි.

**16. ෆේස්බුක් පිටුව සහ යූ ටියුබ් මාධ්‍යය මඟින් මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ කෙටි වීඩියෝ පට සහ සටහන් මඟින් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන (Promotion of ECCD through Facebook, YouTube)**

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන නිල ෆේස්බුක් පිටුව (NSECD Facebook) සහ යූ ටියුබ් චැනලය (NSECD YouTube Channel) යටතේ, මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනයට අදාළව සකස් කරන ලද පෝස්ටු (Post), වීඩියෝ පට සහ දැන්වීම් සටහන් සමාජ මාධ්‍ය වෙත මුදා හැර ඇත.

**17. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය සඳහා සේවාවන් සැපයීම සම්බන්ධයෙන් ග්‍රාමීය කමිටු සාමාජිකයින් දැනුවත් කිරීම සහ කමිටු සාමාජිකයින් බලගැන්වීමේ වැඩසටහන**

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය නියෝජනය කරනු ලබන ළමා අංශයට අදාළ සියලු ආයතන හා නිලධාරීන් ඒකාබද්ධව ග්‍රාම නිලධාරී වසමකට එක බැගින් ග්‍රාමීය කමිටු පිහිටුවීම හා ක්‍රියාත්මක මට්ටමින් පවත්වා ගැනීමේ අවශ්‍යතාව, ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු සාමාජිකයින් දැනුවත් කිරීම හා කමිටු සාමාජිකයින් බලගැන්වීම මේ යටතේ සිදු කරනු ලබයි.

මෙම වැඩසටහන තුළින් සංවර්ධන අවස්ථා ලැබීම, සෞඛ්‍ය හා පෝෂණය, රැකවරණය හා ආරක්ෂාව යන අංශයන්ගෙන් අවදානමට ලක්ව ඇති දරුවන් හඳුනා ගනිමින් ඒ සඳහා අවශ්‍ය මැදිහත්කරණය සිදු කිරීමට අවශ්‍ය දැනුම ලබා දීම සහ ග්‍රාමීය කමිටු සාමාජිකයින් ඒ සඳහා බලගැන්වීම තුළින් දරුවන් සඳහා ආරක්ෂාකාරී පවුල් පරිසරයක් සහ සාමාජීය පරිසරයක් නිර්මාණය කිරීම සිදුකර ඇත.

**18. ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය (ADB)**

අතිශය අවධානමට ලක්වූ සහ අවාසිදායක තත්ත්වයේ වෙසෙන මුල් ළමාවියේ දරුවන් මුල් කාලීනව හඳුනා ගැනීම හා අවශ්‍ය සේවාවන් සඳහා යොමු කිරීම, අනාරක්ෂිත තත්ත්වයන්ට ලක්වන මුල් ළමාවියේ දරුවන් සුරක්ෂිත කිරීම සඳහා ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් හා ඒකාබද්ධව රැකවරණ සැලසුම් සකස් කිරීමට අදාළව මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

මේ සඳහා ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ පළාත් මට්ටමින් පුහුණු වැඩසටහන් 9ක් සඳහා රු.මි. 4.00ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් වූ අතර 2025 වර්ෂය තුළ පළාත් මට්ටමින් පුහුණු වැඩසටහන් 8 ක මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් 307ක් සඳහා රු.මි. 2.40 ක වියදම් දරා ඇත.

## 2.2.4. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

#### ප්‍රධාන කාර්යභාරය

ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත ප්‍රකාරව පුළුල් කාර්යභාරයක් පැවරී ඇති ආයතනයකි. ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නෛතික, පරිපාලන හෝ වෙනත් ප්‍රතිසංස්කරණ සංවර්ධනය කිරීම, මහජනතාවගෙන් ළමා අපයෝජනය සම්බන්ධ පැමිණිලි භාර ගැනීම, ළමුන් සම්බන්ධ ළමා අපයෝජන නඩු ක්‍රියාවලිය නියාමනය, නීතිය සමඟ ගැටෙන හා සම්බන්ධ වන ළමයින් සඳහා ආධාර, නියාමනය සහ පසු විපරම් සිදුකිරීම හා ළමා ආරක්ෂක සේවා සහ පහසුකම් සැපයීම සඳහා අවම ප්‍රමිතීන් සංවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම ඊට ඇතුළත් වේ.

එමෙන්ම, ළමයාගේ උපරිම යහපත සඳහා ළමා අපයෝජන වැළැක්වීමේ හා අපයෝජනයට ගොදුරු වූ ළමයාට ප්‍රතිචාර දැක්වීමේ අරමුණු ඇතිව ජාතික වැඩසටහන් සංවර්ධනය සහ පැවැත්වීම, සියලු ආකාරයේ අපයෝජනවලින් ළමයාගේ ආරක්ෂාව තහවුරු කිරීමට ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රමවේදයන් හා ළමා ආරක්ෂණ දැනුම ප්‍රචලිත කිරීම සඳහා ළමුන්, යෞවනයන්, වෘත්තිකයන් සහ ප්‍රජාව දැනුවත් කිරීම, තොරතුරු සහ අධ්‍යාපනය ලබාදීම හා ළමා ආරක්ෂණය හා ළමා සංවර්ධනය පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ රැස්වීම්, වැඩමුළු, සාකච්ඡා, සහ සංසද ආදිය පැවැත්වීම ද ප්‍රධාන කාර්යයන් අතර වේ.

අධිකාරියේ කාර්යභාරය සිදුකිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නිලධාරීන් අනුයුක්ත කර ඇත. ඔවුන් අධිකාරිය මඟින් යොමු කරන කාර්යයන් හා ඍජුව තමන් වෙත වාර්තා වෙන්නා වූ කාර්යයන් සම්බන්ධයෙන් කටයුතු කරයි.

#### ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

**1. ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධ උද්දේශනය සහ දිස්ත්‍රික්, කොට්ඨාස මට්ටමින් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම.**

ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම මෙම වසරේදීත් සිදුකරන ලදි. මෙහිදී ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන පාර්ශ්වකරුවන් දහය (10) වන අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ, අධ්‍යාපන, ආරක්ෂාව සහ නීති බලාත්මක කිරීම, සෞඛ්‍ය, සමාජ අභිවෘද්ධිය, කම්කරු හා රැකීරක්ෂා, සංචාරක, ජනමාධ්‍ය හා තොරතුරු තාක්ෂණ, කාන්තා සහ ළමා කටයුතු සහ ආපදා කළමනාකරණය සම්බන්ධ වෘත්තිකයන් සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් වැඩමුළු පැවැත්වීම සිදුකරන ලදි. සම්පත් සංචිතයේ නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. 2025 වර්ෂයේදී වැඩසටහන් 44ක් සිදුකර දැනුවත් කර ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2,695කි.

**2. ළමා ආරක්ෂාව සම්බන්ධ ග්‍රාමීය මට්ටමින් ළමුන්ගේ සුරක්ෂිතතාවය වර්ධනය කිරීම උදෙසා ප්‍රජා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ දීපව්‍යාප්ත වැඩසටහන**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ළමා සුරක්ෂිතතාවය වර්ධනය කිරීමට අදාළව ප්‍රජාව බලගැන්වීම, ඒ තුළින් ළමුන්ට වඩාත් සුදුසු පරිසරයක් ඔවුන් විසින් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීම තුළින් ළමා ආරක්ෂණය උදෙසා සක්‍රීය ප්‍රජා ජාලයක් නිර්මාණය කිරීම. (Child Protection Advocacy Network) මෙහි අරමුණු වේ. 2025 වර්ෂයේදී වැඩසටහන් 277ක් සිදුකරන ලදි. දැනුවත් කර ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව 53,849කි.

**3. පාසල් ළමා ආරක්ෂක කමිටු හෙවත් "සුරැකුම් පව්ව" පිහිටුවීම සහ පාසල් ළමා ආරක්ෂක කමිටු සක්‍රීය කිරීම**

අනිවාර්ය අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම සහ එම ළමුන් ළමා අපයෝජනයන්ගෙන් වැළැක්වීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාසල්වල පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම, ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අධ්‍යාපන බලධාරීන් වඩාත් සංවේදී කිරීම මඟින් පාසල්වල ක්‍රියාකාරී ළමා ආරක්ෂක කමිටු ඇති කිරීම සඳහා ඔවුන්ගේ උපරිම සහයෝගය ලබාගැනීම සහ පාසල් ළමා ආරක්ෂක කමිටු ප්‍රවර්ධනය සඳහා වර්ෂය පුරා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙහි මූලික අරමුණු වේ. 2025 වර්ෂයේදී අධ්‍යාපන බලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 37ක් සිදුකරන ලදි. දැනුවත් කර ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2,501කි.

**4. ළමා ආරක්ෂාව පිළිබඳ පාසල් ශිෂ්‍ය නායකයින් සඳහා "ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන" හා විශ්වවිද්‍යාල සිසුන් සඳහා "විශ්වවිද්‍යාල තානාපති" ජාතික වැඩසටහන**

ජ්‍යෙෂ්ඨ පාසල් ශිෂ්‍ය නායකයින් හා විශ්වවිද්‍යාල සිසුන්ගේ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. පාසල් තුළ ළමා අපයෝජන අවම කිරීම සඳහා ශිෂ්‍ය නායකයින්ගේ සහභාගීත්වය ලබා ගැනීම සහ පාසල් ප්‍රජාව ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදු කෙරෙයි. 2025 වර්ෂයේදී දිස්ත්‍රික් 25 නියෝජනය කරමින් පාසල් 246ක් ලියාපදිංචි වී ඇත. සම්පත් සංචිතය සඳහා එක් පුහුණු වැඩසටහනක් සිදු කළ අතර පුහුණුව ලැබූ සංඛ්‍යාව 38කි. විදුහල්පති පුහුණු වැඩසටහන් 25ක් හා දිස්ත්‍රික් පුහුණු 25ක් පවත්වා ඇත.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමග ඒකාබද්ධව රාජ්‍ය විශ්වවිද්‍යාල 17 නියෝජනය කරමින් 2025 වර්ෂයේදී විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපතිවරු ලෙස විශ්වවිද්‍යාල සිසුන් 998ක් ලියාපදිංචි කර ඇත. සම්පත් සංචිතයේ එක් පුහුණු වැඩසටහනක් සිදුකළ අතර පුහුණු වූ සංඛ්‍යාව 95කි. පුහුණු වැඩසටහන් 05ක් පවත්වන ලදි. පුහුණු වූ සංඛ්‍යාව 740කි.

**5. ළමා රැකවරණ සේවා සපයන ආගමික හා පුණ්‍ය ආයතන අධීක්ෂණය සහ ළමා දිවා සුරැකුම් පහසුකම් සපයන මධ්‍යස්ථාන අධීක්ෂණය**

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14(ග) වගන්තියට අනුව ළමයින් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන, ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමනය කිරීම සහ ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා ජාතික මාර්ගෝපදේශයේ විධිවිධාන අනුව ළමා දිවා සුරැකුම් පහසුකම් සපයන මධ්‍යස්ථාන අධීක්ෂණයට අදාළ විධිවිධාන ක්‍රියාවට නැංවීම මෙම වැඩසටහන්වල මූලික අරමුණු වේ. 2025 වර්ෂයේදී ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන 334ක් අධීක්ෂණය සහ නියාමනය කරන ලදි. 2025 වර්ෂයේදී ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන 178ක් අධීක්ෂණය සහ නියාමනය කර ඇත.

**6. ළමා ආරක්ෂාව පිළිබඳව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් හා කාර්ය මණ්ඩල සාමාජිකයන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන**

ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් සවිඥානික හා සංවේදී ගුරු ප්‍රජාවක් හා කාර්ය මණ්ඩලයක් ගොඩනැංවීම තුළින් ළමා හිතකාමී පාසලක අධ්‍යාපනය ලබන සුරක්ෂිත හා සතුටින් සිටින ළමා පරපුරක් බිහි කිරීම මෙහි මූලික අරමුණු වේ. 2025 වර්ෂයේදී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 08ක වැඩසටහන් 08ක් සිදුකර අවසන් කරන ලදි. එමඟින් දැනුවත් කරන ලද මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 3,001කි.

**7. ළමා ආරක්ෂාව පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති හෙද පුහුණු විදුහල්වල හෙද නිලධාරීන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන**

ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් සංවේදී හෙද නිලධාරීන් පිරිසක් බිහි කිරීම තුළින් ළමුන් සම්බන්ධව සිදුකරන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියලු මැදිහත්කරණයන් ළමුන්ගේ උපරිම යහපත පිණිස සිදුකිරීම මෙහි මූලික අරමුණු වේ. 2025 වර්ෂයේදී වැඩසටහන් 03ක් සිදුකළ අතර දැනුවත් කරන ලද මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 610කි.

**8. ළමා ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය හා සන්නිවේදන වැඩසටහන්**

ළමා අයිතීන් සහ ළමා ආරක්ෂාව පිළිබඳ පාසල් ප්‍රජාව, දෙමාපියන්, වෘත්තිකයන්, වැඩිහිටියන් සහ පොදු ජනතාවගේ දැනුම කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම සඳහා තොරතුරු සහ අධ්‍යාපනය ලබාදීම මෙහි මූලික අරමුණ වේ. 2025 වර්ෂයේදී රූපවාහිනී සහ ගුවන්විදුලි වැඩසටහන් 29ක් සඳහා සම්පත් දායකත්වය ලබාදී තිබේ. ප්‍රවෘත්ති නිවේදන 6ක් නිකුත් කරන ලදි. ළමා අපයෝජන පිළිබඳ සදාචාරාත්මක වාර්තාකරණය සම්බන්ධයෙන් ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් හා ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් පවත්වන ලදි. ප්‍රදර්ශන සහ ජංගම සේවා 08ක් පවත්වන ලදි. ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පැමිණ තොරතුරු ලබාගත් 38 දෙනෙකු සඳහා අවශ්‍ය තොරතුරු ලබාදෙන ලදි.

**9. "සිතුවිලි සිත්තම්" සමස්ත ලංකා චිත්‍ර, පෝස්ටර් සහ කාටූන් තරඟාවලිය**

ළමා අපයෝජනවලින් ආරක්ෂා වීම සහ ළමා අයිතීන් පිළිබඳව ළමුන් තුළ දැනුවත්භාවය හා උනන්දුව ඇති කිරීම මෙහි මූලික අරමුණ වේ. 2025 වර්ෂයේ ලෝක ළමා දිනයට සමගාමීව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමා අයිතිවාසිකම් සහ ළමා ආරක්ෂාව තේමා කර ගනිමින් සංවිධානය කරන ලද "සිතුවිලි සිත්තම්" 2025 සමස්ත ලංකා චිත්‍ර, පෝස්ටර් සහ කාටූන් තරඟාවලියේ අවසන් විනිශ්චය කටයුතු සිදුකර ජාතික මට්ටමේ ජයග්‍රාහකයන් 56ක් සහ දිස්ත්‍රික් ජයග්‍රාහකයන් 622ක් ලෙස සමස්ත ජයග්‍රාහකයන් 678ක් තෝරාගන්නා ලදි. "සිතුවිලි සිත්තම් දිස්ත්‍රික් වැඩසටහන් 25ක් පවත්වා ඇත. ජයග්‍රහාකයින්ගේ නම් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වෙබ් අඩවියේ පළ කර ඇත. (www.childprotction.gov.lk)

**10. විශේෂ විමර්ශන, විමර්ශන නියාමනය, අපරාධ නඩු කටයුතු සහ අධිකරණ කටයුතු නියාමනය කිරීම**

ළමා අපයෝජන හේතු කොට වින්දිත වූ ළමුන් සඳහා නෛතික සහාය සැලසීම මෙහි ප්‍රධාන අරමුණ වේ. 2025 වර්ෂයේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය විසින් අධිකරණයේ පෙනී සිටීම් 1,663ක් සම්පූර්ණ කර ඇත. (මහාධිකරණ 971, මහේස්ත්‍රාත් අධිකරණ 692) ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නීති අංශය විසින් අධිකරණයේ පෙනී සිටීම් 8ක් සිදුකර ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පැමිණ සහ දුරකතන මඟින් සයිබර් ආවේක්ෂණ පැමිණිලි 206ක් ලැබී ඇත.

**11. ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක පිහිටුවීම, නඩත්තු කිරීම සහ අයිතිවාසිකම් උල්ලංඝනය වූ ළමුන් සඳහා සහාය වීම සහ නිලධාරීන් පුහුණු කිරීම**

ළමා අපයෝජන හේතුවෙන් වින්දිතභාවයට පත්වන ළමුන් ද්විතීයික වින්දිතභාවයට පත්වීම වැළැක්වීම මෙහි ප්‍රධාන අරමුණ වේ. 2025 වර්ෂයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නව වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකයක් සකස් කරන ලදි. 2025 වර්ෂයේදී වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් 196 අවසන් කරන ලදි. අධිකරණ නියෝග මත හා නීතිපති නියෝග මත විඩියෝ සාක්ෂි පට 251ක්

මුදා හැරීම සිදුකරන ලදි. අධිකරණයේ පෙනී සිටීම් 71ක් සිදුකර ඇත. අධිකරණ නියෝග මත හා නීතිපති නියෝග මත යතුරු ලියන පිටපත් මුදාහැරීම් 247ක් සිදුකර ඇත.

**12.** **ළමා උපකාරක දුරකතන සේවයේ (1929) මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සිදු කිරීම**

ළමා අපයෝජන සම්බන්ධ මහජන පැමිණිලි භාර ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මේ මඟින් කායික, මානසික, ලිංගික අපයෝජන මෙන්ම නොසලකා හැරීම්වලට අදාළ මහජන පැමිණිලි භාරගැනීම ද පැය 24 පුරාම සිදුකරයි. 2025 වර්ෂයේදී 1929 ළමා උපකාරක දුරකතන සේවය වෙත පැමිණිලි 8,235ක් ලැබී ඇත. 1929 ළමා උපකාරක දුරකතන සේවය වෙත වාර්ෂිකව ඇමතුම් 29,475ක් ලැබී ඇත.

**13.** **ජාතික ළමා කේන්ද්‍රීය මනෝ-සමාජීය සහාය සේවාව**

ළමුන්ගේ උපරිම යහපත වෙනුවෙන් ලබාදෙන සේවාවෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ අපයෝජනයට පත් ළමුන්ගේ මානසික තත්ත්වයන් හඳුනාගෙන මනෝ-සමාජීය සහාය සේවාවන් වෙත යොමු කිරීම සහ මානසික යහපැවැත්ම ඉහළ නැංවීම මෙහි මූලික අරමුණු වේ. 2025 වර්ෂයේදී මනෝ-සමාජීය සහාය සහ සම්බන්ධීකරණය කිරීම් 684ක් සිදුකර ඇත. ළමුන් 226ක් සඳහා මනෝ-සමාජීය සහාය හා මැදිහත්වීම් ලබා දී ඇත. පැමිණිලිවල පසුවිපරම් 285ක් සිදුකර ඇත. මනෝ-සමාජීය මැදිහත්කරණයන් ලබාදී අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව 3,409කි. ළමුන් සඳහා මනෝ චිකිත්සනය හා මනෝ උපදේශනය ලබාදීම් 193ක් සිදුකර ඇත. සිද්ධි සම්මන්ත්‍රණ 51ක් පවත්වා ඇත. වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා ළමුන්ගේ පූර්ව මානසික සූදානම් කිරීම වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම් 07ක් සිදුකර ඇත.

**14.** **මනෝ-සමාජීය මැදිහත්කරණ ලබාදීම් සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම**

ළමුන් සඳහා සුරක්ෂිත ළමා හිතකාමී පරිසරයක් ගොඩනැගීම සහ ළමා ආරක්ෂක වෘත්තිකයන් සතු දැනුම යාවත්කාලීන කිරීම මෙන්ම පුහුණු වැඩසටහන් හරහා ලබාගත් දැනුම ප්‍රායෝගිකව වෘත්තිය තුළ භාවිතයට ගැනීම මෙහි මූලික අරමුණු වේ. 2025 වර්ෂයේ පුහුණු වැඩසටහන් 02ක් පවත්වන ලදි.

**15.** **වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව වෙසෙන ළමුන්ගේ යහපැවැත්ම සහතික කිරීම උදෙසා ක්‍රියාත්මක කෙරෙන විශේෂ ප්‍රජා වැඩසටහන**

ළමා ආරක්ෂණය උදෙසා සක්‍රීයව ක්‍රියා කරන වැවිලි ප්‍රජා ජාලයක් නිර්මාණය කිරීම මෙහි මූලික අරමුණ වේ. 2025 වර්ෂයේ වැඩසටහන් 09ක් සිදු කරන ලදි. ප්‍රතිලාභීන් 461කි. විශේෂ ව්‍යාපෘති 02ක් ක්‍රියාත්මක කරන ලදි. ප්‍රතිලාභීන් 26කි.

**16.** **වෙරළබඩ කලාපය ආශ්‍රිත ගම්මානවල ජීවත්වන ළමුන්ගේ ආරක්ෂාව හා යහපැවැත්ම නඟා සිටුවීම උදෙසා ක්‍රියාත්මක කෙරෙන ප්‍රජාපාදක වැඩසටහන**

ළමා ආරක්ෂණය උදෙසා සක්‍රීය වෙරළබඩ කලාපය ආශ්‍රිත ප්‍රජා ජාලයක් නිර්මාණය කිරීම මෙහි මූලික අරමුණ වේ. 2025 වර්ෂයේදී ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 12 ක් පවත්වන ලදි. මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 581 දෙනෙකි.

**17. පාසල් ළමුන් ප්‍රවාහනය කරන රියදුරන් හා සහායකයින් ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන**

පාසල් ළමුන් ප්‍රවාහනය කරන රියදුරන් හා සහායකයින් ළමා ආරක්ෂාව හා යහපැවැත්ම තහවුරු කිරීම උදෙසා බලගැන්වීම මඟින් ප්‍රවාහන සේවයේ ළමා අපයෝජන වැළැක්වීම මෙහි අරමුණ වේ. 2025 වර්ෂයේදී මෙම වැඩසටහන ආරම්භ කරන ලදි. වැඩසටහන් 12ක් පවත්වන ලදි. මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 327 දෙනෙකි.

**18. ළමා ආරක්ෂාව පිළිබඳව පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ ඉගෙනුම ලබන වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන**

පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයෙහි ඉගෙනුම ලබන වෛද්‍යවරුන් ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් සංවේදී පිරිසක් ලෙස පුහුණු කිරීම මඟින් ළමුන් සම්බන්ධ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මැදිහත්කරණයන් ළමුන්ගේ උපරිම යහපත වෙනුවෙන් සිදු කිරීම මෙහි මූලික අරමුණ වේ. 2025 වර්ෂයේදී ළමා ආරක්ෂාව පිළිබඳව පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ අධ්‍යාපනය ලබන වෛද්‍යවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 3ක් පවත්වා ඇත.

## 2.2.5. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

#### ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

**1. කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීමේ සංවර්ධන වැඩසටහන**

කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සඳහා හඳුනාගත් අංශයන් නියෝජනය වන පරිදි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ සඳහා, ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වැඩසටහන මෙන් ම විවිධ ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන් විසින් ක්‍රියාත්මක වැඩසටහන් ද ඉටු කරනු ලබයි.

**2. ව්‍යවසායකත්ව සංවර්ධනය**

දැනුම හා කුසලතාව මත ව්‍යවසායකත්ව ව්‍යාපෘති සඳහා යොමු වන කාන්තාවන් ඇතුළුව, නාගරික අඩු ආදායම්ලාභී කාන්තාවන්, ධීවර කර්මාන්තය ආශ්‍රිත කාන්තාවන්, වතු ආශ්‍රිත කාන්තාවන්, විදේශගත වීමට අපේක්ෂිත කාන්තාවන්, සුවිශේෂී හේතූන් මත සමාජ සංවේදීතාවය අහිමි වූ කාන්තාවන්, දිගු කාලයක් බන්ධනාගාර ගතවූවන්ගේ පවුල්වල ආපදාවට ලක්වූ කාන්තාවන්, නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමවලින් පීඩාවට පත් ග්‍රාමීය කාන්තාවන් හා ස්ත්‍රී මූලික පවුල්වල කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සිදුවේ.

2025 වර්ෂය තුළ ක්‍රියාත්මක වැඩසටහන යටතේ ව්‍යාපෘති 666 ක් ක්‍රියාත්මක කර ඇති අතර, ඒ සඳහා වෙන් කරන ලද මුදල රු.මි. 59.50කි. එයින් ව්‍යාපෘති 488 ක් තනි පුද්ගල ව්‍යාපෘති වන අතර ව්‍යාපෘති 190 ක් කණ්ඩායම් ව්‍යාපෘති ලෙස ක්‍රියාත්මකයි. ඒ අනුව, කාන්තාවන් 5,302 ක් මෙම වැඩසටහන් යටතේ ප්‍රතිලාභ ලබා ඇත.

### 3. ව්‍යවසායක කාන්තාවන් සඳහා වෙළෙඳපොළ ප්‍රවර්ධනය

ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් සවිබලගැන්වෙන කාන්තාවන් සඳහා ප්‍රමුඛ අවශ්‍යතාව වන්නේ වෙළඳ පොළ අවස්ථා සුලබ කිරීමයි. ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන මත ප්‍රධාන වැඩසටහන් කීපයක් ක්‍රියාත්මක කරනු ලබයි. එමඟින් ව්‍යවසායිකාවන් ලෙස සාර්ථකත්වයට පත් වූ කාන්තාවන් ප්‍රාදේශීය, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමින් ඇගයීම ප්‍රධාන වැඩසටහනකි.

එමෙන්ම, මෙම ව්‍යවසායිකාවන් වෙත දේශීය සහ විදේශීය වෙළඳ පොළ වෙත ප්‍රවේශ වීමේ පහසුකම් සලසා දීම සඳහා කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය හා වෙළෙඳ පොළ අවස්ථා ඇති කරනු ලබයි. ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරන ලද "ලිය ශක්ති" කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය සහ අලෙවි පොළ ප්‍රධාන වේ. අමතර වශයෙන් සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි වෙළඳ පොළ පැවැත්වීම සඳහා කටයුතු කර ඇත.

ව්‍යවසායිකාවන් කණ්ඩායමක් ලෙස සංවිධානගතව අලෙවි පොළ පැවැත්වීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අලෙවි කුටි (Canopy Huts) ලබා දීමත් මෙම වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වේ.

අවිධිමත් ලෙස වෙළඳාමේ යෙදෙන කාන්තාවන් සඳහා "ජංගම අලෙවි කුටි" ලබා දීම තවත් එක් වෙළඳ පොළ අවස්ථා ප්‍රවර්ධනය කරන ලද ව්‍යාපෘතියක් වේ. ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව පැවති "ලිය ශක්ති" ජාතික කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවි පොළ සඳහා විශේෂ අනුග්‍රහයක් ජපන් අන්තර්ජාතික සහයෝගීතා ආයතනය (JICA) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) විසින් ලබා දීම සිදු කරන ලදි.

### 4. ව්‍යවසායක කාන්තාවන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම

අඩු ආදායම්ලාභී සහ සමාජීය සහ ආර්ථික වශයෙන් බලපෑමට ලක් වූ කාන්තාවන් ව්‍යවසායිකාවන් ලෙස සවිබලකරණයේ දී ව්‍යවසායකත්වය සම්බන්ධ දැනුම සහ කුසලතාවන් සංවර්ධනය සහ විශේෂයෙන් මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ ව දැනුවත්භාවය ලබා දීම අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන ඇත.

ඒ අනුව, වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම යටතේ "ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ පුහුණු වැඩසටහන" සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. ඒ යටතේ රු.මි. 1.20 ක් වෙන් කර ඇත. එක් වැඩසටහනක් සඳහා රුපියල් 25,000.00 ක ප්‍රතිපාදන වෙන් කෙරෙන අතර අවම වශයෙන් ප්‍රතිලාභීන් 40 ක කණ්ඩායමක් සඳහා ව්‍යවසායකත්වය පිළිබඳ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය සිදු කරයි.

ඒ සඳහා තාක්ෂණික දායකත්වය කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, කාර්මික සංවර්ධන මණ්ඩලය, විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානය, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය වැනි ආයතන මඟින් ලබා දේ. 2025 වර්ෂය තුළ දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් 49 ක් පැවැත්වූ අතර ප්‍රතිලාභීන් 1,960 ක් දැනුවත් කිරීම ඉලක්ක කර ඇත.

ග්‍රාමීය කාන්තාවන්ගේ ආර්ථික ශක්තිය වැඩි දියුණු කිරීමේ අපේක්ෂාවෙන් ක්‍රියාත්මක සියලුම ණය වැඩසටහන් සඳහා (චක්‍රීය ණය වැඩසටහන/ වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම/ විදේශගත වීමට අපේක්ෂිත කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදනය/ පශු සම්පත්/ දිරිය මංපෙත ආදී වැඩසටහන්) සුදුසුකම් ලැබිය හැක්කේ ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ පුහුණුව ලබා ගැනීමෙන් අනතුරුව ය.

**ආදර්ශ ප්‍රතිලාභී සහතික පත්‍රය**



2025.09.30 දිනට වැඩසටහන් 28 ක් පවත්වා ප්‍රතිලාභීන් 1,198 ක් දැනුවත් කර ඇත. ඒ සඳහා රුපියල්.700,000/- ක මුදලක් වැය කර ඇත.

එමෙන්ම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ ළමා නිවාසවල සිට සමාජගත වන අවු. 18 ඉක්ම වූ ගැහැනු ළමුන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටමේ හෙද පුහුණුව හා ආහාර නිෂ්පාදන පුහුණු වැඩසටහනක් පවත්වනු ලබයි. මෙය රාජ්‍ය - පෞද්ගලික හවුල්කාර ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක අතර තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) මඟින් තාක්ෂණික පුහුණුව ලබා දීමත් ආයතනය විසින් එම පුහුණුලාභීන් රැකියාගත කිරීමත් සිදු කරයි.

සුවිශේෂී හේතූන් මත සමාජ සංවේදීතාවය අහිමි වූ කාන්තාවන් ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා “දිවියට අරුතක්” තේමාව යටතේ වැඩසටහනක් ක්‍රියාත්මක කරයි.
ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ පීඩාවට පත් වූ කාන්තාවන් විසින් කරනු ලබන ඉල්ලීම් හෝ වෙනත් පාර්ශ්වයන් වෙතින් කෙරෙන ඉල්ලීම් අනුව මෙම ව්‍යවසායකත්ව වැඩසටහන ක්‍රියාත්මක කරයි.

මෙම වැඩසටහන තුළ දීර්ඝකාලීනව ස්වාමිපුරුෂයන් බන්ධනාගාරගත වූ ගෘහ කුටුම්භයන්හි ආර්ථිකය නඟා සිටුවීම මෙන්ම සුළු වැරදි සඳහා බන්ධනාගාරගතව නිදහස් වන කාන්තාවන් නැවත බන්ධනාගාරගත වීම වැළැක්වීම අරමුණු කරගත් මැදිහත් වීම් සිදුකරයි.

### 5. වෙළඳපොළ ප්‍රවර්ධනය සහ කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවි පොළ

විවිධ අභියෝග හමුවේ කාන්තාවක් ලෙස ඇය පවුල තුළ විවිධ ආර්ථික හා සමාජ ගැටලු රැසකට මුහුණ දෙනු ලබයි. එවන් තත්ත්ව අභිබවා ව්‍යවසායිකාවක් ලෙස නිෂ්පාදන හා සේවා සපයමින් ව්‍යාපාරික කටයුතුවල නිරත වීමට වෙර දරන කාන්තාවන් හඳුනාගෙන ඔවුන්ගේ නිෂ්පාදන හා සේවාවන්හි ගුණාත්මක තත්ත්වය ඇති කිරීම, වෙළඳ පොළ අවස්ථා හඳුන්වා දීම, වෙළඳ පොළ පුළුල් කිරීම මෙන්ම ඩිජිටල් අලෙවිකරණය වෙත යොමු කිරීම තුළින් ආර්ථිකය වැඩි දියුණු කර ගැනීම මෙන්ම පවුල තුළ හා සමාජීය තත්ත්වය යහපත්ව පවත්වාගෙන යෑමට යෝග්‍ය පවුල් පරිසරයක් ඇති කිරීම පිණිස මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව, දිස්ත්‍රික් 11 ආවරණය වන පරිදි අමාත්‍යාංශ ප්‍රතිපාදන රු. 877,571.00 ක් යොදා ගනිමින් ව්‍යවසායකයින් 563 ක් සඳහා වෙළඳ පොළ අවස්ථා ලබා දීමට හැකි විය.

### 6. උපදේශන වැඩසටහන

දුර්වල මානසික සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවන කණ්ඩායම්වලට ප්‍රජා මට්ටමේ බලපෑම් අවම කිරීම, උපදේශනයේ නවෝත්පාදනය හරහා ප්‍රමිතිගත උපදේශන සේවාවක් ලබා දීම, උපදේශන

ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම හා සේවාව නිරීක්ෂණය කිරීම සඳහා මාර්ගෝපදේශ ස්ථාපිත කිරීම අරමුණ වේ.

ඒ සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සේවාවන් සැපයීම සඳහා උපදේශන නිලධාරි සහ උපදේශන සහකාරවරුන්ගේ සේවාව ක්‍රියාත්මක වේ. ඊට අමතරව විශේෂ මධ්‍යස්ථාන 12 ක් උපදේශන සේවාවන් ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා ඇත. මෙම සේවා මධ්‍යස්ථාන අනුරාධපුර, මොණරාගල, නුගතලාව, රත්නපුර, කටුනායක (නිදහස් වෙළඳ කලාපය), කෑගල්ල, මාතර, ගාල්ල, ගම්පහ, කළුතර හා කොළඹ ප්‍රදේශයන්හි (උපදේශන ඒකක) ක්‍රියාත්මකයි.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත හිංසනයට ලක් වන කාන්තාවන් මුහුණ දෙන සමාජීය දුෂ්කරතා මඟ හැරවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අරමුණ කර ගනිමින් උපදේශන දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබන අතර, ඒ යටතේ සේවාලාභීන් 1,410ක් පමණ දැනුවත් කර ඇත.

## 7. තාවකාලික කාන්තා රැකවරණ නිවාස

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත හිංසනයට ලක්වන කාන්තාවන්ගේ ආරක්ෂාව සහ අයිතිවාසිකම් තහවුරු කිරීම යන අරමුණ පෙරදැරි කර ගනිමින් දිවයිනේ තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථාන 11 ක් පවත්වාගෙන යනු ලබයි.

වින්දිත කාන්තාවන්ගේ ආරක්ෂාව, පුනරුත්ථාපනය, ස්වාධීනත්වය සහ සවිබලගැන්වීම ඉලක්ක කරගත් පරිපූර්ණ රැකවරණ නිවාස සේවා ඇතුළු ඔවුන් වෙනුවෙන් සහාය සේවා වැඩිදියුණු කිරීම මඟින් ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට එරෙහි ලිංගික සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම මෙහි මූලික අරමුණ වේ.

වින්දිත කාන්තාවන්ට සහ ඔවුන්ගේ දරුවන්ට සහ එහි අවදානමට පත්ව සිටින්නන්ට පහත සඳහන් සේවාවන් සපයනු ලැබේ.

- ක්ෂණික සහන සහ රැකවරණ නිවාස සහාය
- ආරක්ෂාව සහ ආරක්ෂිත පරිසරය
- ප්‍රතිකර්ම, පුනරුත්ථාපන සහ පිළියම් සේවා
- යොමු කිරීම් සේවා
- සමාජගත කිරීම සඳහා වන වෘත්තීය පුහුණුව
- පසුවිපරම

ඒ සඳහා දැනට රැකවරණ නිවාස 11 ක් දිස්ත්‍රික් 10 ක ක්‍රියාත්මක වේ. මේ අතරින් මධ්‍යස්ථාන 2ක් අමාත්‍යාංශ ඍජු ප්‍රතිපාදන මඟින් හා අනෙක් රැකවරණ නිවාස ස්වේච්ඡා සංවිධානවල සහාය ඇතිව පවත්වා ගෙන යනු ලබයි.

2025 වර්ෂය තුළ කාන්තාවන් 668 දෙනෙකු සඳහා සේවාවන් සපයා ඇති අතර, මේ දක්වා දරන ලද වියදම රු.මි.17.49 කි.

## 8. කිලිනොච්චිය වැන්දඹු හා ගෘහ මූලික කාන්තා ජාතික මධ්‍යස්ථානය

වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන්ගේ සුභ සාධනය සඳහා 2015.11.13 දින ආරම්භ කරන ලද මෙම මධ්‍යස්ථානය මඟින් කාන්තාවන් සඳහා තාක්ෂණික පුහුණුව අනුව ආදායම් උත්පාදන අවස්ථා ලෙස තල් නිෂ්පාදන, මැහුම් ව්‍යාපෘති, විසිතුරු භාණ්ඩ, ගව පාලනය, එළු පාලනය යනාදි ව්‍යාපෘති සඳහා අවශ්‍ය පහසුකම් සපයන අතර, ඒ සඳහා අවශ්‍ය පුහුණුව හා ආධාර ලබා දෙනු ඇත.

2025 වර්ෂයේ දී ගෘහමූලික කාන්තාවන් සවිබලගැන්වීම සඳහා වැඩසටහන් 12 ක් ක්‍රියාත්මක කිරිම සඳහා රු.මි 2.00ක ප්‍රතිපාදන වැය කර ඇත.

**ජාත්‍යන්තර දින සැමරුම්**

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය ජාත්‍යන්තර දින සැමරුම් දෙකක් වාර්ෂිකව සිදු කරනු ලබයි. එයින් “ජාත්‍යන්තර කාන්තා දිනය” සැමරීමේ ජාතික ආයතනය ලෙසද “ලෝක මානසික සෞඛ්‍ය” දිනය සැමරීමේ එක් පාර්ශ්වයක් ලෙස ද කටයුතු කරයි.

**9. ජාත්‍යන්තර කාන්තා දින ජාතික සැමරුම**

ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව ශ්‍රී ලංකාව “ජාත්‍යන්තර කාන්තා දින ජාතික සැමරුම් වැඩසටහන” පවත්වනු ලබන අතර, මෙවර **“තැනුමට තිරසර හෙටක් - සවිමත් ඇය වේ මහක්”** තේමා කර ගනිමින් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ සියලු ආයතන සමඟ එක්ව එය සංවිධානය කරන ලදි.

මෙවර ජාත්‍යන්තර කාන්තා දින ජාතික සැමරුම 2025.02.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව “ජාතික කාන්තා සතිය - 2025” ලෙස ප්‍රකාශයට පත් කර 2025 මාර්තු 02 සිට 2025 මාර්තු 08 දක්වා පැවැත්වුණි.

ඒ අනුව, සමස්ත දිවයිනම ආවරණය වන පරිදි විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන සමඟ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල කේන්ද්‍රකර ගනිමින් වැඩසටහනක් සිදු කරන ලදි.

**10. මානසික සෞඛ්‍ය දිනය**

එක්සත් ජාතීන්ගේ සෞඛ්‍ය සංවිධානය (WHO) මගින් සෑම වසරකම ඔක්තෝබර් 10 වන දින ලෝක මානසික සෞඛ්‍ය දිනය ලෙස නම් කර ඇත. 2025 වසර සඳහා තේමාව “ප්‍රජාව: මානසික යහපැවැත්මට එක්ව සහාය වීම” යන්නයි. මීට සමගාමීව ජාතික, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය වශයෙන් වැඩසටහන් පවත්වන ලදි.

**11. කාන්තා සංවිධාන ජාලය ගොඩනැගීම**

කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබලගැන්වීම සඳහා ග්‍රාම සේවා වසම් මට්ටමින් වයස අවුරුදු 18ට වැඩි සියලුම කාන්තාවන් ඒකරාශී කර ගනිමින් කාන්තා කාර්යය සංවිධාන පිහිටුවා ගන්නා අතර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ද එම කාන්තා නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් ප්‍රාදේශීය කාන්තා බලමණ්ඩල පිහිටුවා ඇත. කාන්තාවන් දිස්ත්‍රික් මට්ටමින් ඒකරාශී කිරීම සඳහා දිස්ත්‍රික් 25ටම සම්බන්ධ කාන්තා නිලධාරින් මඟින් දිස්ත්‍රික් කාන්තා බල මණ්ඩල පිහිටුවනු ලබයි. මෙම ජාලය මඟින් සමස්ත කාන්තා ප්‍රජාවම රටේ සංවර්ධනයට දායක කර ගැනීමත්, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් සිදු කරන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් සිදු කරනු ලබයි.

- කාන්තා කාර්යය සංවිධාන (වසම් මට්ටමින් ) 12,994
- ප්‍රාදේශීය කාන්තා බලමණ්ඩල (ප්‍රාදේශීය මට්ටමින්) 317
- දිස්ත්‍රික් කාන්තා බලමණ්ඩල (දිස්ත්‍රික් මට්ටමින්) 25ක්ද සක්‍රීය ව පවතී.

විදේශීය අරමුදල් භාවිතයෙන් සිදුකළ ව්‍යාපෘති

## 12. ව්‍යවසායකත්වය, නායකත්වය හා ජාලකරණය හරහා කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම

ව්‍යවසායකත්වය, නායකත්වය හා ජාලකරණය හරහා කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා JICA (ජපන් අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සිය) මඟින් කාන්තා කාර්ය සංවිධාන ප්‍රතිසංවිධානය හා කාන්තා ව්‍යවසායකයන් බලගැන්වීමේ ව්‍යාපෘති අම්පාර හා මොනරාගල දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වේ. JICA ආයතනය ව්‍යාපෘතිය සඳහා සෘජුව වියදම් දරයි. ව්‍යාපෘති කාල සීමාව 2023 - 2027 වර්ෂය දක්වා වේ.

මෙහිදී කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම අංශය යටතේ එක් දිස්ත්‍රික්කයකින් කාන්තා ව්‍යවසායිකාවන් 09 ක් බැගින් ව්‍යවසායිකාවන් 18 දෙනෙකු තෝරා ගන්නා ලද අතර, ඔවුන් සඳහා භාණ්ඩ හා උපකරණ ලබා දීමේ ක්‍රියාවලියෙහි ප්‍රසම්පාදන කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.

එමෙන්ම, මෙම ව්‍යාපෘතියෙහි කාන්තා කාර්ය සංවිධාන සක්‍රීය කිරීමේ අංගය යටතේ කාන්තා කාර්ය සංවිධාන සාමාජිකාවන් සාමාජීය වශයෙන් සවිබලගැන්වීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 56 ක් මේ වන විට පවත්වා ඇත. තව ද මෙහි ක්‍රියාකාරකමක් වන කාන්තා කාර්ය සංවිධාන ව්‍යවස්ථා සංශෝධනය කිරීමේ කටයුතු සහ ජාතික බල මණ්ඩලය පිහිටුවීම සඳහා කැබිනට් පත්‍රිකාව සකස් කිරීමේ කටයුතු ද මේ වනවිට අවසන් අදියරෙහි පවතී.

## 13. නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිරසර ප්‍රජා මූලික පවුල් සවිබලගැන්වීම - Saemaul

(සෙමාවුල් ගෝලීය පදනම) මඟින් අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම, 2023 අගෝස්තු 25 සමාරම්භක උළෙලේදී සිදුවිය. මෙමඟින් ශාන්තිපුර පාසලේ පිළිසකර කිරීම් සිදු කර ඇත. බිඳුණුවැව කෘෂිකර්ම මධ්‍යස්ථානයේදී ගොවීන් 60 ක් සඳහා කෘෂිකාර්මික පුහුණුව ලබා දීමට සැලසුම් කිරීම, නුවරඑළිය දිස්ත්‍රික්කයේ බඹරකැලේ සෙමාවුල් එළවළු එකතුකිරීමේ මධ්‍යස්ථානය නවීකරණය කිරීම සඳහා නැවත ටෙන්ඩර් කැඳවීම සිදු කර ඇත. මෙම ව්‍යාපෘතිය 2022-2026 වර්ෂ සඳහා ක්‍රියාත්මක වේ. ප්‍රදායක ආයතනය සෘජුව වියදම් දරයි.

## 14. ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සංවර්ධන ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය - ආසියානු සංවර්ධන බැංකුව - ADB

වෘත්තීය හා ධාරිතා පුහුණු ලබා දීම හා අඩු ආදායම්ලාභී කාන්තාවන් සඳහා ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙමඟින් සිදුවේ. ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් රු.මි.10.76 ක මුදලක් වැය කර ඇති අතර, මෙය 2022-2026 වර්ෂ සඳහා ක්‍රියාත්මක වේ.

## 15. කාන්තා අයිතීන් සුරක්ෂිත කිරීමේ ව්‍යාපෘති - UNFPA (එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල)

වාර්ෂික ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වේ. කාන්තා රැකවරණ මධ්‍යස්ථාන සඳහා CDMA දුරකථන 42 ක බිල් ගෙවීම, වනිතා සංවර්ධන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පාඨමාලාව පැවැත්වීම සහ තාවකාලික රැකවරණ මධ්‍යස්ථානවල ක්ෂේත්‍ර නිරීක්ෂණය මේ යටතේ සිදුවේ. මූල්‍ය ප්‍රගතිය රු.මි.0.29 කි.

**16. එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය - (UN Women) හා ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් - 2024-2025**

කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම යටතේ එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය (UN Women), ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය හා ඒකාබද්ධව 2024 මාර්තු මස සිට 2025 මාර්තු දක්වා ව්‍යාපෘති හතරක් (4) ක්‍රියාත්මක කරන ලදි. මෙහිදී එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් ව්‍යවසායක කාන්තාවන් 43 දෙනෙකු බැගින් ව්‍යවසායක කාන්තාවන් 500 දෙනෙකු බලගැන්වීම සිදු කර ඇත.

කොරියානු රජයේ ආධාර යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල/ හාලිඇල/ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි සමාජ ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් වූ කාන්තාවන් ආමන්ත්‍රණය කිරීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය.

**17. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)**

තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථාන පරිපාලනය පිළිබඳ ජාතික මාර්ගෝපදේශය සම්බන්ධයෙන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කමිටු සාමාජිකයන් දැනුවත් කිරීමට සහාය වීම මේ යටතේ සිදුවිය. මාතර දිස්ත්‍රික්කය හැර ඉතිරි කාන්තා රැකවරණ මධ්‍යස්ථාන පවතින දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කමිටු මේ වන විට දැනුවත් කර ඇත.

## 2.2.6. ජාතික කාන්තා කමිටුව

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

#### ප්‍රධාන කාර්යභාරය

සමානාත්මතාවය තහවුරු වූ, හිංසනයෙන් තොර, කාන්තාවන්ට හිතකර ශ්‍රී ලාංකික සමාජයක් බිහි කිරීමේ අරමුණින් පිහිටුවන ලද ජාතික කාන්තා කමිටුවේ ප්‍රධාන කාර්යය වන්නේ, ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ප්‍රවර්ධනය කිරීම, සමානාත්මතාවය තහවුරු කිරීම හා පූර්ණ සංවර්ධනයට ඉවහල් වන ප්‍රතිපත්ති හා නීති පද්ධතීන් සකස් කිරීම වේ. මේ සඳහා ජාතික කාන්තා කමිටුව මඟින් නිර්දේශ හා සහාය ලබා දීම, අධීක්ෂණය කර ඇගයීම සිදු කරනු ලබයි.
ඒ අනුව, ජාතික කාන්තා කමිටුව තුළ පැමිණිලි මධ්‍යස්ථානයක් සහ පැය 24 පුරා අවශ්‍ය සේවා සපයන 1938 කාන්තා උපකාරක දුරකතන සේවාව ක්‍රියාත්මක වේ. එම සේවාව මඟින් නීති උපදෙස් ලබා දීම, උපදේශනය ලබා දීම හා අදාළ ආයතන වෙත පැමිණිලිකරුවන් යොමු කිරීම හා වාර්තා කැඳවීම සිදු කරනු ලබයි. එමෙන්ම, ලැබෙන පැමිණිලි සම්බන්ධව කාලීන පසුවිපරම් සිදු කිරීම ද ජාතික කාන්තා කමිටුවේ ප්‍රධාන කාර්යභාරයකි.

#### ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

**1. සයිබර් ප්‍රචණ්ඩත්වය, ප්‍රවාහනයේදී සිදුවන හිරිහැර සහ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන**

පොදු ප්‍රවාහනයේදී හා අන්තර්ජාලය තුළ නව යෞවන යෞවනියන්ට සිදුවන හිංසනයන් වැළැක්වීම හා නව යොවුන්විය තුළ ඔවුන් මුහුණදෙන අභියෝග ජය ගැනීම සඳහා දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම අරමුණ වේ. ගම්පහ, හම්බන්තොට, රත්නපුර, කිලිනොච්චි සහ කොළඹ යන දිස්ත්‍රික්කයන්හි දී වැඩසටහන් 05ක් පවත්වා ඇත. මෙම වැඩසටහන් පැවැත්වීම සඳහා රු.මි.0.47 ක් වියදම් වී ඇත.

**2. විවාහ අපේක්ෂිත තරුණ තරුණියන් සඳහා පූර්ව විවාහ පිළිබඳ උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (ප්‍රීතිමත් පවුල් ජීවිතයක් සඳහා)**

විවාහයෙන් පසු පවුල් ජීවිතය තුළ ඇති වන ගැටුම් අවම කර ගනිමින් සාර්ථක පවුල් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය උපදේශනය ලබා දීම අරමුණයි. යාපනය, බදුල්ල, පුත්තලම, ගම්පහ, කොළඹ, කෑගල්ල, ගාල්ල සහ කළුතර යන දිස්ත්‍රික්කයන්වල වැඩසටහන් පැවැත්වීම සඳහා රු.මි.0.79ක් වැය වී ඇති අතර වැඩසටහන් 09ක් පවත්වා ඇත.

**3. විවාහයට පෙර විවාහ අපේක්ෂිතයින්ට පූර්ව විවාහ උපදේශනය ලබා දීම සඳහා විවාහ රෙජිස්ටාර්වරුන් හා උපදේශන නිලධාරීන්/ උපදේශන සහකාරවරුන් බලගැන්වීමේ වැඩසටහන**

විවාහයෙන් පසුව ඇතිවන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහාත්, විවාහය තුළදී මතුවන ගැටලුකාරි තත්ත්වයන්ට මුහුණ දෙමින් සාර්ථක විවාහ ජීවිතයක් පවත්වාගෙන යාම සඳහාත්, විවාහ අපේක්ෂිත යුවලක් විවාහ වීමට ප්‍රථම අවබෝධයකින් යුතුව, විවාහ ජීවිතයට පිවිසීම ඉතා සුදුසු වන අතර, පූර්ව විවාහ උපදේශනය ඒ සඳහා සාධනීය විසඳුමක් ලෙස පෙන්වා දිය හැකිය.

ඒ අනුව, විවාහය ලියාපදිංචි කිරීමට පෙර විවාහ රෙජිස්ටාර්වරුන් වෙත පැමිණ නම් ලබා දෙන විවාහ අපේක්ෂිත යුවල් වෙත පූර්ව විවාහ උපදේශනය ලබා දීම සඳහා උපදේශන නිලධාරීන්/ උපදේශන සහකාරවරුන් හා විවාහ රෙජිස්ටාර්වරුන් බලගැන්වීම සහ ඔවුන් අතර සම්බන්ධීකරණයක් ඇති කිරීම මෙහි අරමුණයි.

බදුල්ල, ගාල්ල, මාතලේ, මඩකලපුව, මන්නාරම, කිළිනොච්චිය, වව්නියාව, මුලතිව්, පුත්තලම, නුවරඑළිය, පොළොන්නරුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන්හිදි වැඩසටහන් 12 ක් පවත්වා ඇති අතර ඒ සඳහා රු.මි.1.03ක් ප්‍රතිපාදන වැය වී ඇත.

**4. කාන්තාවන්ට හා ළමයින්ට සිදුවන හිංසනය වැළැක්වීම පිළිබඳ සේවා ස්ථානයන්හි කාර්යය මණ්ඩල දැනුවත් කිරීම, ආකල්ප සංවර්ධනය සහ නීති සම්බන්ධය පිළිබඳව දැනුම වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම**

රැකියා ස්ථානයන්හි කාන්තා හිංසනය අවම කිරීම පිළිබඳ දැනුවත් කිරීම මෙම වැඩසටහනින් අරමුණු කෙරේ. කොළඹ, ගම්පහ, ගාල්ල යන දිස්ත්‍රික්කයන්වල වැඩසටහන් 06 ක් පවත්වා ඇත. මේ සඳහා රු.මි.0.19ක් වැය වී ඇත.

**5. ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව රජරට විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ සමාජීය විද්‍යා අධ්‍යනාංශයේ විශේෂවේදී සහ සාමාන්‍යවේදී උපාධි හදාරනු ලබන විද්‍යාර්ථයින් සඳහා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා ඒ ආශ්‍රයෙන් සිදුවන හිංසනය වැළැක්වීම සහ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරිමේ වැඩසටහන**

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා ඒ ආශ්‍රයෙන් සිදුවන හිංසනය සහ සයිබර් අපරාධවලින් කාන්තාවන් හා දරුවන් මුදවා ගැනීම සඳහා විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින් දැනුවත් කිරීම මෙහි අරමුණ වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ රජරට විශ්වවිද්‍යාලයේදී වැඩසටහන් පවත්වා අවසන් කර ඇත. මෙම වැඩසටහන සඳහා රු.මි.0.49ක් වැය වී ඇත.

**6. පළාත් මට්ටමින් පවත්වන කාන්තාවන් දේශපාලනය සඳහා බලගැන්වීමේ නායකත්ව පුහුණු වැඩමුළුව**

දේශපාලනයට අවතීර්ණ වීම සඳහා අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්පවලින් හෙබි කාන්තා නායිකාවන් බිහිකිරීම හා දේශපාලනයට අවතීර්ණ වීම සඳහා කාන්තාවන් දිරිමත් කිරීම වැඩසටහනේ අරමුණු වේ. මහනුවර, කුරුණෑගල, අනුරාධපුරය මාතර සහ කොළඹ යන දිස්ත්‍රික්කයන්හි වැඩසටහන් 05 ක් පවත්වා ඇති අතර රු.මි.12 ක් වැය වී ඇත.

**7. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ළමා ආරක්ෂාව පිළිබඳව වතු සුභසාධන නිලධාරීන් දැනුවත් කිරීම සහ උපදේශන වැඩසටහන්**

වතු ප්‍රජාව වෙත වඩාත් යහපත් ජීවන මට්ටමක් හා තෘප්තිමත් රැකියා පරිසරයක් ගොඩනැඟීම සඳහා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන හා ළමා අයිතිවාසිකම් හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ වතු සුභසාධන නිලධාරීන් දැනුවත් කිරීම මින් අරමුණු කර ඇත. ඒ අනුව, මෙම වැඩසටහන නුවරඑළිය දිස්ත්‍රික්කයේදී පැවැත්වූ අතර රු.මි.0.15ක් වැය වී ඇත.

**8. සේවා ස්ථානවල සේවය කරන නිලධාරීන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව පනත පිළිබඳව දැනුවත් කිරීම**

ගෘහස්ථ හිංසන පනත පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම, කාන්තාවන්ට රැකියා ස්ථානයේ සිදුවන හිංසනයන් අවම කිරීම, ගෘහස්ථ හිංසනය අවම කිරීම මඟින් පවුල තුළ සාමකාමී පරිසරයක් නිර්මාණය කිරීම, නිලධාරීන්ගේ රැකියා ඵලදායිතාව ඉහළ නැංවීම අපේක්ෂිත අරමුණු වේ. කොළඹ දිස්ත්‍රික්කයේ වැඩසටහන් 5ක් පවත්වා ඇති අතර, ඒ සඳහා රු.මි.0.43ක් වැය වී ඇත.

**9. රැකියා ස්ථානවල තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තා සහභාගීත්වය හා නියෝජනය වැඩිකිරීමේ ප්‍රවේශයක් වශයෙන් විශ්වවිද්‍යාලවල සිසු සිසුවියන් දැනුවත් කිරීම.**

දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තා සහභාගීත්වය සහ රජයේ සහ පෞද්ගලික ආයතනයන්හි තීරණ ගන්නා මට්ටම් තුළ, කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම මෙහි අපේක්ෂිත අරමුණු වේ. පේරාදෙණිය සහ රුහුණු යන විශ්ව විද්‍යාලවල වැඩසටහන් 02ක් පැවැත්වූ අතර ඒ සඳහා රු.මි. 0.27ක් වැය වී ඇත.

**10. කාන්තා හිංසනය වැළැක්වීම සඳහා වන අන්තර්ජාතික දින 16 වැඩසටහන**

කාන්තාවන්ට එරෙහි සියලු හිංසන පිටු දැකීම උදෙසා සෑම වර්ෂයකම නොවැම්බර් මස 25 සිට දෙසැම්බර් මස 10 වන දින දක්වා දින 16ක කාල පරාසයක් තුළ අන්තර්ජාතික දින 16 නමින් වැඩසටහන් සංවිධානය කරනු ලබයි. 2025 වර්ෂයේ ද එම කාල පරාසය තුළ ජාතික කාන්තා කමිටුව මඟින් වැඩසටහන් රාශියක් පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදි.

ඒ අනුව, විදේශීය අරමුදල් (**එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල**) භාවිත කරමින් සමාරම්භක වැඩසටහන කොළඹදී පැවැත්වීමට කටයුතු කළ අතර, ඒ සඳහා රු.මි.0.31 වැය වී ඇත.

එමෙන්ම, අන්තර්ජාතික දින 16 වැඩසටහනට සමගාමීව පූර්ව විවාහ උපදේශනය පිළිබඳ දැනුවත් කිරීම, උසස් අධ්‍යාපනය ලබන සිසුන් සඳහා සයිබර් අපරාධ වැළැක්වීම සම්බන්ධව දැනුවත් කිරීමේ ආදී වැඩසටහන් සහ රැකියා ස්ථානයේ සිදුවන හිංසනයන් අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වූ අතර ඒ සඳහා රු.මි.0.35ක් වැය වී ඇත.

## 11. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා මැදිහත් වීම

ජාතික කාන්තා කමිටුවේ කාර්යභාර්ය තවදුරටත් කාර්යක්ෂමව හා ඵලදායිතාවයෙන් යුතුව ඉටු කරමින් භාෂාත්‍රයෙන්ම පැය 24 පුරාම ක්‍රියාත්මක වන ගාස්තු රහිත 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව හා පැමිණිලි මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබයි. 2025 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන විට 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව සඳහා පැමිණිලි 2,251ක් ලැබී ඇති අතර, පැමිණිලි මධ්‍යස්ථානය සඳහා ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 476කි.

## 12. විදේශීය ප්‍රතිපාදන - (සාක් සංවර්ධන අරමුදල ) සාර්ක් සාමාජික රටවල කාන්තාවන් සහ ළමුන් සඳහා ගාස්තු රහිත උපකාරක දුරකථන සේවාව ශක්තිමත් කිරීම සඳහා වන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය සඳහා සාර්ක් සංවර්ධන අරමුදල මඟින් ප්‍රතිපාදන සපයයි. ව්‍යාපෘති කාල සීමාව 2024.08.02 සිට 2025.08.01 වේ. 2025 වර්ෂයෙහි මූල්‍ය ප්‍රගතිය ඇමරිකානු ඩොලර් 24,176 කි. 2025/2026 වර්ෂ සඳහා ඇමරිකානු ඩොලර් 152,607 ක් ලබා දී ඇති අතර ඊට අදාළ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- පැය 24 පුරා ක්‍රියාත්මක වන ඇමතුම් මධ්‍යස්ථානය සහ මැදිහත්වීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
- ආයතන ධාරිතාව ගොඩනැඟීම.
- 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව හා 1929 ළමා උපකාරක දුරකථන සේවාව පිළිබඳ හා අදාළ විෂයන් පිළිබඳ රාජ්‍ය හා පෞද්ගලික අංශය දැනුවත් කිරීම.
- 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව හා 1929 ළමා උපකාරක දුරකථන සේවාව පිළිබඳ මහජන දැනුවත් කිරීම සඳහා උපදේශන ද්‍රව්‍ය සංවර්ධනය කර ප්‍රකාශයට පත් කිරීම.

උක්ත ක්‍රියාකාරී සැලසුමෙහි පහත උප ක්‍රියාකාරකම් යටතේ දිවයිනම ආවරණය වන ආකාරයට ක්‍රියාකාරකම් සිදු කෙරේ.

- 1938 උපකාරක දුරකථන සේවාව පිළිබඳ හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ආදී කරුණු පිළිබඳ අමාත්‍යාංශ සහ දිස්ත්‍රික් මට්ටමින් (ප්‍රධාන නිලධාරීන්) දැනුවත් කිරීමේ වැඩසටහන් 5 ක් සම්පූර්ණ කර ඇත.
- ජංගම සේවා දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීම මේ වන විට සැලසුම් කර ඇත.
- 1938 උපකාරක දුරකථන සේවාව පිළිබඳ දිස්ත්‍රික්ක/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ උපදේශන නිලධාරින් සහ පාර්ශ්වකරුවන් (වෙනත් නිලධාරීන්) දැනුවත් කිරීම.
  මේ වන විට දැනුවත් කිරීමේ වැඩසටහන් 4 ක් සම්පූර්ණ කර ඇත.
- 1938 උපකාරක දුරකථන සේවාව සහ පැමිණිලි මධ්‍යස්ථානයට ලැබෙන පැමිණිලි පිළිබඳව පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම සහ අමාත්‍යාංශ නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් අතර සහයෝගීතාවය ගොඩනැංවීම සඳහා වැඩසටහන් පැවැත්වීම යටතේ මේ වන විට වැඩසටහන් 4 ක් සම්පූර්ණ කර ඇත.
- තෝරාගත් බිහිරි, ගොළු මධ්‍යස්ථානවල අය සඳහා සයිබර් අපරාධ වැළැක්වීම පිළිබඳව සංඥා භාෂාවෙන් දැනුවත් කිරීම යටතේ මේ වන විට එක් වැඩසටහනක් සම්පූර්ණ කර ඇත.
- පෞද්ගලික අංශයේ (ආයෝජන කළාප සහ වෙනත් පෞද්ගලික සමාගම්/ඇඟලුම්) ආයතනවල 1938 උපකාරක දුරකතන සේවාව පිළිබඳ, ප්‍රජනන සෞඛ්‍ය, සේවා ස්ථානයේ ලිංගික හිංසනය වැලැක්වීමේ හා ලිංගාශ්‍රිත රෝග/එච්.අයි.වී වැළැක්වීම සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැලැක්වීම යන වැඩසටහන් 11ක් මේ වනවිට සම්පූර්ණ කර ඇත.

- 1938 උපකාරක දුරකථන සේවාව පිළිබඳ බස් රථ නාමකරණය, ප්‍රචාරණ ද්‍රව්‍ය මුද්‍රණය මේ වන විට සැලසුම් කර ඇත.
- බස් මගී ආවරණ තුළ 1938 හා 1929 උපකාරක දුරකථන සේවා පිළිබඳ ප්‍රචාරණ නාම පුවරු සවි කිරීම සිදු කරමින් පවතී. දරුවන් සම්බන්ධයෙන් වීඩියෝ පට දෙකක් මුද්‍රණය කර ඇත.
- පැය 24 පුරා ක්‍රියාත්මක වන ඇමතුම් මධ්‍යස්ථානයේ දත්ත කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කිරීම මේ වන විට ප්‍රසම්පාදන අවසන් අදියරේ පවතී.
- නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය යටතේ මේ වන විට නිලධාරීන් 30ක් සඳහා පුහුණු වැඩසටහන් 2 ක් පවත්වා ඇත. නිලධාරින් 13 දෙනෙකු නීති හා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා සඳහා යොමු කර ඇත.
- වින්දිත කාන්තාවන්ට ආධාර කිරීම.
  මන්නාරම දිස්ත්‍රික්කයේ කාන්තාවන් 600 ක් සඳහා ආධාර ලබා දී ඇති අතර, සමගාමී ක්‍රියාකාරකම් මේ යටතේ සිදු කෙරේ.
- 1938 ගාස්තු රහිත දුරකථන සේවාව ඔස්සේ පැමිණෙන සේවාලාභී ගැටලු සම්බන්ධ සිද්ධි කළමනාකරණය කිරීම පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහනක් ගම්පහ දිස්ත්‍රික්කයේ පවත්වා ඇත.

# පරිච්ඡේදය 03

## 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු. | | සටහන | සත්‍ය 2025 රු. | 2024 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | 2,159,457,417 | 1,871,293,464 | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,787,101 | 12,222,189 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 108,805,638 | 62,186,627 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | - | - | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 2,270,050,156 | 1,945,702,280 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 2,270,050,156 | 1,945,702,280 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 23,479,094 | 11,718,685.00 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 2,246,571,062 | 1,933,983,595 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | |
| 1,260,830,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 1,214,705,967 | 1,551,229,154 | ඒසීඒ-2(ii) |
| 374,170,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 323,230,841 | 1,154,380,780 | |
| 14,765,000,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 12,515,708,485 | 9,761,260,582 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| 16,400,000,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 14,053,645,293 | 12,466,870,516 | |
| | මූලධන වියදම් | | | | |
| 64,356,800 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 42,744,592 | 18,330,874 | ඒසීඒ-2(ii) |
| 506,762,900 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 251,022,492 | 185,838,833 | |
| 92,900,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 50,210,467 | 230,957,600 | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 3,300,000 | හැකියා වර්ධනය | 14 | 2,081,583 | 1,172,724 | |
| 347,474,917 | වෙනත් මූලධන වියදම් | 15 | 134,244,774 | 124,278,100 | |
| 1,014,794,617 | මුළු මූලධන වියදම් (උ) | | 480,303,908 | 560,578,131 | |
| | තැන්පතු ගෙවීම් | | 3,245,098 | 11,188,853 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 103,339,616 | 66,058,607 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 106,584,714 | 77,247,460 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 14,640,533,915 | 13,104,696,107 | |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | (12,393,962,853) | (11,170,712,512) | |
| | අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | | (12,393,962,853) | (11,170,712,512) | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | (12,393,962,853) | (11,170,712,512) | ඒසීඒ-3 |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | තත්‍ය 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| මූල්‍ය නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 717,331,233 | 2,027,888,028 |
| මූල්‍ය වත්කම් | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 164,158,786 | 169,624,808 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **881,490,019.00** | **2,197,512,836** |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 164,090,480 | 114,062,298 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 717,331,233 | 2,027,888,028 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| ජංගම වගකීම් | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 68,305 | 55,562,509 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **881,490,018.00** | **2,197,512,835** |

පිටු අංක 07 සිට 76 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 77 සිට 143 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ......................... | ......................... | ......................... |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : තරංගනී වික්‍රමසිංහ | නම : | නම : |
| තනතුර : ලේකම් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය | තනතුර : | දිනය : |
| දිනය : | දිනය : | |

ප්‍රධාන ගණකාධිකාරී
කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය
05 වන මහල, සෙත්සිරිපාය, අදියර II
බත්තරමුල්ල.

2

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පි

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සත්‍ය 2025 රු. | සංශෝධිත 2024 රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 74,165,709 | 69,256,161 |
| අග්‍රිම ලැබීම් | 2,159,457,417 | 1,871,293,463 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 45,527,201 | 63,071,432 |
| තැන්පතු ලැබීම් | 1,787,101 | 12,222,189 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **2,280,937,428** | **2,015,843,245** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,495,504,670 | 1,673,071,899 |
| සහනාධාර සහ මාරුකිරීම් | 413,801,917 | 17,023,459 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් | 53,420,874 | |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 7,028,653 | 9,786,615 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 23,479,094 | 11,718,695 |
| අත්තිකාරම් ගෙවීම් | 103,245,939 | 65,895,336 |
| තැන්පතු ගෙවීම් | 3,245,098 | 11,188,853 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **2,099,726,246** | **1,788,684,857** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **181,211,182** | **227,158,388** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **-** | **-** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් | 182,222,882 | 227,158,388 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **182,222,882** | **227,158,388** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(182,222,882)** | **(227,158,388)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **(1,011,700)** | **-** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | 1,011,700 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **1,011,700** | **-** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **1,011,700** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)** | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් - අදාළ නොවේ

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය - අදාළ නොවේ

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

**වියදම් ශීර්ෂ අංකය** : 171

**අමාත්‍යාංශයේ නම** **: කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය**

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වියදමෙහි නම | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තථ්‍ය වියදම | රු.,000<br>උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|---|
| | | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදන | | |
| වැඩසටහන් (1) | (1) පුනරාවර්තන | 475,000 | 481,779 | 427,735 | 89% |
| | | | | | |
| | (2) ප්‍රාග්ධන | 29,000 | 29,000 | 18,512 | 64% |
| | | | | | |
| | උප එකතුව | 504,000 | 510,779 | 446,247 | |
| | | | | | |
| | | | | | |
| වැඩසටහන (2) | (1) පුනරාවර්තන | 14,300,000 | 15,918,221 | 13,625,911 | 86% |
| | | | | | |
| | (2) ප්‍රාග්ධන | 734,000 | 985,795 | 461,792 | 47% |
| | | | | | |
| | උප එකතුව | 15,034,000 | 16,904,016 | 14,087,703 | |
| | | | | | |
| | මුළු එකතුව | 15,538,000 | 17,414,795 | 14,533,950 | |
| | | | | | |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| | | | | | රු. ,000 |
|---|---|---|---|---|---|
| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන ,ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
| 1 | සියළුම දි. ලේ. කා. | වැඩසටහන් පැවැත්වීම සඳහා වියදම් | 9,050 | 52 | 1% |
| 2 | දි. ලේ. කා. - අම්පාර/ පොලොන්නරුව/කෑගල්ල | ක්ෂේත්‍ර නිලධාරින්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා | 1,000 | 75 | 8% |
| 3 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | නිදහස් දුම්රිය ප්‍රවේශපත්‍ර/දීමනා | 50,000 | 5,103 | 10% |
| 4 | සියළුම දි. ලේ. කා. | දිස්ත්‍රික් නිලධාරී දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ගමන් වියදම් | 1,400 | 124 | 9% |
| 5 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | වැටුප් ලෙජර මුද්‍රණය | 6,500 | 347 | 5% |
| 6 | දි.ලේ. මාතර | කාර්ය මන්ඩල පුහුණු | 3,000 | 85 | 3% |
| 7 | දි.ලේ. අනුරාධපුර | වනිතා සංවර්ධන නිලධාරි වන බී.පී.එම්.ජී. කුමාරිහාමිගේ විනය පරීක්ෂනයේ පරිගනක ක්‍රියාකරුගේ දීමනාව | 234,000 | 24 | 0% |
| 8 | සියළුම දි. ලේ. කා. | ක්ෂේත්‍ර නිලධාරින්ගේ ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා - කාන්තා | 8,000 | 7,137 | 89% |
| 9 | දි.ලේ. ගම්පහ /පුත්තලම | ලැප්ටොප් යන්ත්‍ර අළුත්වැඩියාව | 200 | 19 | 9% |
| 10 | දි.ලේ. අම්පාර/ පොලොන්නරුව | ක්ෂේත්‍ර නිලධාරින්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා | 500 | 224 | 45% |
| 11 | දි.ලේ.බදුල්ල/මහනුවර/මොනරාගල/ගාල්ල/මාතලේ/රත්නපුර/ අනුරාධපුර/කෑගල්ල/කළුතර | ක්ෂේත්‍ර නිලධාරින්ගේ කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා | 1,000 | 826 | 83% |
| 12 | දි.ලේ. මහනුවර | රාජකාරි කටයුතු සඳහා මුද්‍රණ යන්ත්‍රයක් ලබා ගැනීම | 1,000 | 44 | 4% |
| 13 | දි.ලේ. කෑගල්ල/රත්නපුර/මහනුවර/මාතලේ/නුවරඑළිය | ක්ෂේත්‍ර නිලධාරින්ගේ මූලික පරිගණක පුහුණුව සඳහා | 300 | 60 | 20% |
| 14 | සියළුම දි. ලේ. කා. | පූර්ව විවාහ උපදේශන, සයිබර් ප්‍රචණ්ඩත්වය, ජාතික සමාජභාවය වැඩසටහන් සඳහා | 70,000 | 3,887 | 6% |
| 15 | සියළුම දි. ලේ. කා. | රැකවරණ නිවාස සඳහා පරිපාලන වියදම්/කමිටු රැස්වීම් | 40,000 | 35,471 | 89% |
| 16 | සියළුම දි. ලේ. කා. | කාන්තා ස්වයං රැකියා වැඩසටහන් | 63,000 | 52,821 | 84% |
| 17 | සියළුම දි. ලේ. කා. | ක්ෂේත්‍ර නිලධාරින්ගේ ගමන් වියදම් -මුල් ළමාවිය සංවර්ධන නිලධාරි | 9,200 | 7,862 | 85% |
| 18 | සියළුම දි. ලේ. කා. | ක්ෂේත්‍ර නිලධාරින්ගේ ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා - මුල් ළමාවිය සංවර්ධන නිලධාරි | 3,300 | 3,173 | 96% |
| 19 | දි.ලේ. මාතර/මාතලේ/රත්නපුර/කුරුණෑගල | මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ට ලැප්ටොප් ලබා දීම | 200 | 99 | 49% |
| 20 | සියළුම දි. ලේ. කා. | ප්‍රගති සමාලෝචන රැස්වීම් (කාර්තු සඳහා) | 3,000 | 2,309 | 77% |
| 21 | සියළුම දි. ලේ. කා. | ගැබිනි මව්වරුන් සඳහා පෝෂණ දීමනාව | 9,000,000 | 8,137,074 | 90% |
| 22 | සියළුම දි. ලේ. කා. | පෙර පාසැල් දරුවන් සඳහා උදෑසන ආහාර වේල | 3,200,000 | 2,526,861 | 79% |
| 23 | සියළුම දි. ලේ. කා. | ගුරු අභිමානි-පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනා ලබා දීම | 1,050,000 | 1,000,088 | 95% |
| 24 | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | පුද්ගල පඩිනඩි | 371,000 | 322,208 | 87% |
| 25 | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | මෙහෙයුම් වියදම් | 137,000 | 115,676 | 84% |
| 26 | දි.ලේ.කා. මාතර/ත්‍රිකුණාමලය/කෑගල්ල | ඔටිසම් දරුවන් සඳහා ඉදිකෙරෙන දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ගොඩනැගිලි ඉදිකිරීම | 48,157 | 28,526 | 59% |
| 27 | දි.ලේ. කළුතර/කෑගල්ල/හම්බන්තොට/ගාල්ල | සමාජ සේවා දෙපාර්තමේන්තුව - ඔටිසම් දරුවන් සඳහා ඉදිකෙරෙන දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ලීබඩු සඳහා | 25,870 | 17,251 | 67% |
| 28 | දි.ලේ. මාතර/හම්බන්තොට/ගාල්ල/කළුතර/කෑගල්ල/ත්‍රිකුණාමලය | ඔටිසම් ඇතුළු ආබාධ සහිත දරුවන් සඳහා ඉදිකෙරෙන දිවා සුරැකුම් මධ්‍යස්ථානවලට අවශ්‍ය යන්ත්‍රසූත්‍ර | 10,743 | 6,877 | 64% |
| 29 | දි.ලේ. මාතර/හම්බන්තොට/ගාල්ල/කළුතර/කෑගල්ල/ත්‍රිකුණාමලය/ සමාජ සේවා දෙපාර්තමේන්තුව | ඔටිසම් දරුවන් සඳහා ඉදිකෙරෙන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීම | 167,730 | 43,801 | 26% |
| 30 | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | ප්‍රාග්ධන වියදම් | 743,000 | 40,300 | 5% |
| 31 | සියළුම දි. ලේ. කා. | ජාතික සතිය, මුල් ළමාවිය සංවර්ධනය සඳහා දෙමාපියන් දැනුවත් තිරීමේ වැඩසටහන,බන්ධනාගාරයේ රැඳවියන්ගේ දරුවන් සඳහා දිවාසුරැකුම් මධ්‍යස්ථාන සඳහා | 19,000 | 14,711 | 77% |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

2/19/25, 1:00 PM https://newcigas.treasury.gov.lk/T_Statements_24/T24_Asset_Final.aspx

**Cumulative Non Financial Asset Accounts Report- Central Govt-2024**

FINAL 2024

**Land-9153:** 112,300,000.00 Table: SA 82
**Building- 9151:** 160,313,100.00 Year: 2024
**Machinary-9152:** 830,718,672.28 Rpt Date 2/19/2025 1:00:20 PM
**WIP-9160:** 924,556,255.53 Head 171
**Intangible-9154:** 0.00
**Lease-9180:** 0.00

| Ledger | category | Item | Code | Opn_Bal | Opn_Bal_Add | TransferIn | Purchase | Disposal | Balance |
|---|---|---|---|---|---|---|---|---|---|
| 9151 | 1.1-Dwellings | | 61111 | 79,875,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 79,875,000.00 |
| | | Quarters | ****6111107 | 79,875,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 79,875,000.00 |
| 9151 | 1.2-Non Residential Building | | 61112 | 80,438,100.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 80,438,100.00 |
| | | Office Building | ****6111201 | 80,438,100.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 80,438,100.00 |
| 9160 | 1.4-WIP-Building & Structure | | 61114 | 825,646,143.64 | 0.00 | 0.00 | 98,910,111.89 | 0.00 | 924,556,255.5 |
| | | WIP-Building & Structure | ****611140 | 825,646,143.64 | 0.00 | 0.00 | 98,910,111.89 | 0.00 | 924,556,255.5 |
| 9152 | 2.1-Transport Equipment | | 61121 | 635,500,000.00 | 1,800,000.00 | 0.00 | 0.00 | 2,800,000.00 | 634,500,000.0 |
| | | Passenger vehicle | ****6112101 | 635,500,000.00 | 1,800,000.00 | 0.00 | 0.00 | 2,800,000.00 | 634,500,000.0 |
| 9152 | 2.2-Other Machinary & Equipment | | 61122 | 176,797,051.42 | 5,262,400.00 | 2,898,152.00 | 85,965,070.85 | 74,704,001.99 | 196,218,672.2 |
| | | Office Equipment | ****6112201 | 6,124,469.15 | 331,000.00 | 22,600.00 | 840,600.00 | 102,000.00 | 7,216,669.15 |
| | | Computer Equipment | ****6112202 | 59,708,031.34 | 798,800.00 | 1,978,850.00 | 84,035,641.10 | 74,593,001.99 | 71,928,320.45 |
| | | Electrical Equipment | ****6112203 | 16,235,416.41 | 562,600.00 | 387,379.00 | 636,748.00 | 0.00 | 17,822,143.41 |
| | | Communication Equipment | ****6112204 | 6,123,944.60 | 43,500.00 | 182,700.00 | 0.00 | 0.00 | 6,350,144.60 |
| | | Furniture | ****6112205 | 88,601,189.92 | 3,526,500.00 | 326,623.00 | 452,081.75 | 9,000.00 | 92,897,394.67 |
| | | Musical Instruments | ****6112206 | 4,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 4,000.00 |
| 9153 | 4.1-Land | | 61410 | 112,300,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 112,300,000.0 |
| | | Land | ****614100 | 112,300,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 112,300,000.0 |

REMARKS

This is a computer-generated document. No signature is required.

-

Report Generated by the new CIGAS Web Application--Developed by S.Tharshan - Director, Dept of State Accounts

https://newcigas.treasury.gov.lk/T_Statements_24/T24_Asset_Final.aspx 1/1

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. VOT/B/MWCA/02/2025/15

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026 මැයි 29 දින

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය ගිණුම් අංශය 08 JUN 2026 ලැබුණා

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය 05 JUN 2026 ආයතන අංශය Add Sec (Admin)

ලේකම්,

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය.

ශීර්ෂය 171 - කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

සහතික කරන ලද ගිණුම සහ යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

වී.ඩී සීතා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත :- අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } VOT/B/MWCA/02/2025/15 ඔබේ අංකය / உமது இல. / Your No. }     දිනය / திகதி / Date } 2026 මැයි 29 දින

ලේකම්,

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය

**ශීර්ෂය 171 - කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 171 - කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව පසුව නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය,



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

Page 3 of 9

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.6.1 මූලධන වියදම්

2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 හි 7.8 හා 7.9 වගන්තීන් අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් වත්කම් අත්පත් කර ගැනීමට දරන වියදම් ද, මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් සටහන් කර තිබුණද, 2024 වර්ෂයට අදාළ සංසන්දනාත්මක සංඛ්‍යා වගන්ති අංක 7.10 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය මගින් හෙළිදරව්කර නොතිබුණි.

#### 1.6.2 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.5 ඡේදය අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ශේෂයට, අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂයේ සහ වර්ෂය අවසානයේ වූ අග්‍රිම ශේෂයේ එකතුව සමාන වියයුතු වුවත් එම ශේෂයන් අතර රු.මිලියන 1.01ක වෙනසක් පැවතුණි.

#### 1.6.3 මූල්‍ය නොවන වත්කම්

2025 වර්ෂයේ අයවැය යෝජනාවක් අනුව පරිපූරක ඇස්තමේන්තුවක් මගින් ලද රු.මිලියන 250 ක ප්‍රතිපාදන උපයෝගී කරගෙන ආයතනගත ළමුන් අධිකරණ වෙත රැගෙන යාම ඒම සඳහා ළමාහිතකාමී ප්‍රවාහන පද්ධතියක් ස්ථාපනය කිරීම වෙනුවෙන් පළාත් පරිවාස දෙපාර්තමේන්තු වෙත ලබාදීම සඳහා අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී මිළදීගත් රු.මිලියන 175.02 ක්වූ වෑන්රථ 09 ක් අදාළ පළාත් පරිවාස දෙපාර්තමේන්තු වෙත සමාලෝචිත වර්ෂයේදී භාරදී තිබුණද, එම මූල්‍ය නොවන වත්කම් අමාත්‍යාංශ ගිණුම් මගින් ඉවත්කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු.මිලියන 175.02 ක් වැඩියෙන් සටහන් වී තිබුණි.

### 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබූ බව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) මුදල් රෙගුලාසි 50 (ii) අනුව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙලකර ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවද එසේ කටයුතු නොකිරීම හේතුවෙන් අමාත්‍යාංශය විසින් ඇස්තමේන්තු කළ මූලධන වැය විෂයයන් 10 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 17 ක් සඳහා සලසා ගෙන තිබූ ප්‍රතිපාදන වලින් සියයට 51 ත් සියයට 100 ත් අතර පරාසයක් තුළ ඉතිරිවීම් වාර්තා වී තිබුණි.

(ආ) වාර්ෂික අයවැය ප්‍රතිපාදන සලසාගෙන නොමැති වැය විෂයයන් 03 ක් සඳහා මුදල් රෙගුලාසි 66 අනුව එකතුව රු.මිලියන 56.06 ක ප්‍රතිපාදන මාරුකරගෙන තිබුණද, එම මුදලින් රු.මිලියන 27.33 ක් හෙවත් සියයට 49 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

2025 දෙසැම්බර් 14 දිනැති අංක 02/2025 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 6.1 ඡේදයට අනුව බැදීම් හා බැරකම් හෙළිදරව් කළයුතු වුවත් එකතුව රු.මිලියන 2.49 ක්වූ බැරකම් 17 ක් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළයුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට වූ ප්‍රකාශයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.4 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති,රීති හා රෙගුලාසියට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේ **XIV** වැනි පරිච්ඡේදයේ 4.1 උප වගන්තිය | 225,927 | රාජකාරි සඳහා ගමන් බිමන් යන නිලධරයෙකුට ස්වකීය කාර්ය ස්ථානයෙන් බැහැරව රාජකාරි සඳහා පිටවී සිටින කාලය වෙනුවෙන් වැය කරන ලද යැපීම් සහ නවාතැන් සඳහා සංයුක්ත දීමනා ලබාගත හැකි වුවද, එසේ නොමැතිව අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් රැකියා ස්ථානයෙන් බැහැරව රාජකාරි සඳහා සහභාගී වූ දින 21 ක ආහාරපාන හා නවාතැන් පහසුකම් වෙනුවෙන් තත්කාර්ය අත්තිකාරම් මගින් වියදම් ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| (ආ) | 2013 ඔක්තෝබර් 07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2013 මගින් සංශෝධනය කරන ලද ආයතන සංග්‍රහයේ viii වැනි පරිච්ඡේදයේ 10.1 ඡේදයේ<br>"ආ" , "ඇ" වගන්ති | 174,929 | ලිත් මාසයකට උපරිම දින දෙකක් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ව අනුමැතිය මත සේවයේ යෙදවීම කළහැකි වුවද, අදාළ අනුමැතියක් ලබා නොගෙන නිලධාරීන් 06 දෙනෙකු සේවය කළ නිවාඩු දින 12 ක් හා මසකට දින 02 ට වඩා වැඩකිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය නොමැතිව සේවය කළ දින 07 ක් සඳහා නිලධාරීන් 03 දෙනෙකු වෙත නිවාඩු දින දීමනා ගෙවා තිබුණි. |

**3.5 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම**

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 09 ඡේදයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) අනුව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත් අවස්ථා 05 කදී ලබාගත් රු. 202,735 ක අතුරු අග්‍රිම පියවීමට දින 18 සිට දින 29 ක් දක්වා කාලයක් ගත කර තිබුණි.

Page 6 of 9

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) අනුව කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්වයේ නිලධාරීන්ට පමණක් තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා දීමට ගණන් දීමේ නිලධාරියෙකුට හැකි වුවද, අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු වෙත අවස්ථා 09 කදී රු.13,771 සිට රු.80,884 දක්වා වූ පරාසයකින් තත්කාර්ය අතුරු අග්‍රිම සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

අනාරක්ෂිත තත්වයන්ට මුහුණ දෙන මුල් ළමාවියේ දරුවන් ඉන් මුදවා ගනිමින් එම දරුවන් සඳහා රැකවරණ සැලසුම් සකස් කිරීම පිළිබඳව මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද පුහුණු කිරීමේ වැඩසටහන මගින් අදාළ දරුවන් සඳහා විශේෂ අවධානය යොමුකරමින් ක්ෂේත්‍ර රාජකාරී මඟින් ඒවා වාර්තා කිරීම, අවශ්‍ය රැකවරණ සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීමට සැලසුම් කර තිබුණද, අදාළ නිලධාරීන් විසින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා සිදුකළ දායකත්වය පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය නොවුණි.

4.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

(අ) 171-2-6-2-2509 වැය විෂය යටතේ කාන්තාවන්ට හා ළමයින්ට සිදුවන හිංසනය වැළැක්වීම පිළිබඳ සේවා ස්ථානයන්හි කාර්යය මණ්ඩල දැනුවත් කිරීම, ආකල්ප සංවර්ධනය හා ඒ සම්බන්ධ නීතිය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමේ වැඩසටහන දිස්ත්‍රික්ක 07 ක් ආවරණය වන පරිදි වැඩසටහන් 07 ක් පෞද්ගලික අංශයේ සේවකයින් 1000 ක් සම්බන්ධ කර පැවැත්වීමට සැලසුම්කර තිබුණද, දිස්ත්‍රික්ක 03 ක වැඩසටහන් 06 ක් පවත්වා ඒ සඳහා සේවකයින් 667 ක් පමණක් සම්බන්ධ කරගෙන තිබුණි. ඒ අනුව අපේක්ෂිත ඉලක්ක ළඟාකරගෙන නොතිබුණි.

(ආ) තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය හා නියෝජනය වැඩි කිරීමේ ප්‍රවේශයක් වශයෙන් විශ්ව විද්‍යාලවල සිසු සිසුවියන් දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා 171-2-6-2-2509 වැය විෂය යටතේ රු.මිලියන 0.45 ක ප්‍රතිපාදන වෙන්කර කොළඹ, ගම්පහ සහ අනුරාධපුර යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි එක් සාකච්ඡාවක් සහ වැඩසටහන් 03 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, මාතර හා මහනුවර දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි වැඩසටහන් 02 ක් පමණක් පවත්වා ඒ සඳහා එකතුව රු.මිලියන 0.26 ක වියදම් දරා තිබුණි.

Page 7 of 9

4.2 වත්කම් කළමනාකරණය

2015 ජුනි 08 දින ගංවතුරට හසුවීමෙන් හානි වූ ජීප් රථයක් සඳහා රු.මිලියන 6.81 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණද, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් රු.මිලියන3.36ක් පමණක් හානිපූර්ණය කර තිබුණි. ඒ අනුව රක්ෂණ සංස්ථාවෙන් නොලැබුණු රු.මිලියන3.45 ක මුදල වසර 07 කට පසු එනම් 2021 දෙසැම්බර් 30 දින අමාත්‍යාංශය විසින් ගෙවා 2022 ජනවාරි 13 දින රථය නිදහස් කර ගෙන තිබුණි. වාහන අනතුර සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පත්කරන ලද කමිටුව විසින් 2016 ජූනි 16 දින නිකුත් කළ වාර්තාව හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2024 මාර්තු 19 දින නිකුත්කළ ලිපිය අනුව වාහන අනතුර සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගැනීමට තීරණය කර තිබුණද, ඒ අනුව අමාත්‍යාංශය කටයුතු නොකිරීම හේතුවෙන් රු.මිලියන3.45 ක් වූ අලාභ අයකර ගැනීමට නොහැකි වී තිබුණි. තවද මෙම වාහනය 2023 වර්ෂයේදී භාවිතයට ගැනීමට නොහැකිවීම හේතුවෙන් ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත භාරදී තිබුණි.

4.3 කළමනාකරණ දුර්වලතා

(අ) 2024 ජූලි 29 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 02/2024 හි ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු- 2025 අනුව එක් සේවා ස්ථානයක අවුරුදු 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති විට ස්ථාන මාරු කිරීම කළ යුතු වුවද, ඒකාබද්ධ සේවයේ 2025 ජූනි 30 වන විට අවුරුදු 05 ඉක්මවා සේවය කර තිබුණු සංවර්ධන නිලධාරී, කළමනාකරණ නිලධාරී, රියදුරු, කාර්යාල කාර්ය සහායක යන තනතුරු දරන සේවකයින් 925 ක් පමණ 2025 වර්ෂයේ ස්ථාන මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම වලින් පීඩාවටපත්, අඩු ආදායම්ලාභී, ග්‍රාමීය කාන්තාවන් සඳහා ස්වයං රැකියා ව්‍යාපෘති ආධාර ලබාදීමට 2025 වර්ෂයේදී ප්‍රතිලාභීන් 42 ක් සඳහා ප්‍රතිපාදනය රු.මිලියන 3.85 ක් ලබාදී තිබුණද, නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම වලින් පීඩාවට පත්වී ඇති බව තහවුරු කිරීම සඳහා අදාළ තොරතුරු මෙන්ම ව්‍යාපෘති වාර්තාවේ ක්ෂුද්‍ර මූල්‍ය ණය පිළිබඳව සඳහන් කර ඇති කරුණු පරීක්ෂා කළ බවත් ඒවා නිවැරදි බවටත් සහතිකයක් අදාළ වනිතා සංවර්ධන නිලධාරීන් විසින් ලබාදී නොතිබුණු අතර අඩු ආදායම්ලාභීන් යැයි තීරණය කිරීමේ පදනම හා කුමන ආදායම් මට්ටම අනුව, අඩු ආදායම්ලාභීන් බවට අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් සිදුකළ තහවුරු කිරීමක් ලබාගැනීමටද අදාළ නිලධාරීන් කටයුතුකර නොතිබුණි.

Page 8 of 9

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ) අඩු ආදායම්ලාභී නාගරික කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන 2025 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 ක ප්‍රතිලාභීන් 40 ක් සඳහා ක්‍රියාත්මක කිරීමට 171-2-6-7-2509 වැය විෂය යටතේ රු.මිලියන 3.72 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී සැලකිල්ලට ගතයුතු කරුණු, ව්‍යාපෘති කාල රාමුව, ප්‍රතිලාභීන් ස්වයං රැකියාගත කිරීමේ වෙළෙඳ පොළ පිළිබඳව හා ඒවා අඛණ්ඩව පවත්වාගෙන යාම, පසු විපරම් ක්‍රමවේදය හා ප්‍රගතිය වාර්තා කිරීම පිළිබඳව ලිඛිත උපදෙස් ඇතුළත් ක්‍රමවේදයක් හෝ ඇගයීමේ ක්‍රියාවලියක් සකස් කර ක්ෂේත්‍ර නිලධාරීන් වෙත ලබාදීමට කාන්තා කාර්යාංශය හෝ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය කටයුතු නොකිරීම හේතුවෙන් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති වල අරමුණු නිසි පරිදි ඉටු වන්නේද යන්න සහ සුදුසු ප්‍රතිලාභීන් තෝරාගෙන තිබේද යන්න තහවුරු කරගැනීමට නොහැකි විය.

5. අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති පුරප්පාඩු 62 සම්බන්ධයෙන් සමාලෝචනය කර අමාත්‍යාංශයේ අවශ්‍යතාවය අනුව සේවකයින් බඳවා ගැනීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

වී.ඩී සීතා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

Page 9 of 9

# පරිච්ඡේදය 04

## කාර්යසාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100 % - 90 % | 75 % - 89 % | 50 % - 74 % |
| දිස්ත්‍රික්ක 25 සඳහා දිස්ත්‍රික් කාන්තා හා ළමා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම (25*4) - කමිටු රැස්වීම් සංඛ්‍යාව | √ | | |
| ලිංගික හා ස්ත්‍රී -පුරුෂ සමාජභාවීය ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වන දෙවන පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම (2024-2028) | | | √ |
| ගර්භණී හා කිරිදෙන මව්වරුන්ට රු. 45,000/- ක පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන- ගර්භණී මව්වරු සංඛ්‍යාව | √ | | |
| පෙර පාසල් දරුවන්/මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා උදෑසන ආහාර වේලක් ලබාදීමේ වැඩසටහන - ප්‍රතිලාභ ලබාදුන් පෙර පාසල් දරුවන් සංඛ්‍යාව | √ | | |
| පෙර පාසල් ගුරුවරියන් සඳහා රුපියල් 2500/- ක මාසික දීමනාවක් ලබාදීමේ "ගුරු අභිමානී" වැඩසටහන- දීමනාව ලබාදුන් පෙර පාසල් ගුරුවරු සංඛ්‍යාව | √ | | |
| දරුවන්ගේ අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කිරීම සඳහා ආර්ථික අපහසුතා සහිත දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීම- ආධාර ලබා දුන් දරුවන් සංඛ්‍යාව | √ | | |
| අවදානම් සහගත දරුවන් වෙනුවෙන් ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම - ක්‍රියාත්මක කරන ලද ආරක්ෂණ සැලසුම් සංඛ්‍යාව | √ | | |
| ළමා සමාජ හා ළමා සභා වැඩසටහන - පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | √ | | |
| ළමුන්ට එරෙහි හිංසනය වැළැක්වීමේ හා ප්‍රතිචාර දැක්වීමේ බහුආංශික වැඩසටහන් පැවැත්වීම- පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | | √ | |
| පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමේ ජාතික වැඩසටහන (සුරකුම් පවුර) - පිහිටුවන ලද කමිටු සංඛ්‍යාව | √ | | |
| පාසල් තුළ ළමා අපයෝජන අවම කිරීම සඳහා ශිෂ්‍ය නායකයින්ගේ සහභාගිත්වය ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කෙරෙන "ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන"-ලියාපදිංචි කරන ලද පාසල් සංඛ්‍යාව | | √ | |

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100 % - 90 % | 75 % - 89 % | 50 % - 74 % |
| ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ සංඛ්‍යාව | | | √ |
| අඩු වයස් විවාහ වැළැක්වීම සඳහා පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | √ | | |
| 1938 කාන්තා උපකාරක දුරකථන සේවය - පැමිණිලි හා මැදිහත්වීම් | √ | | |
| උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් සයිබර් හිංසනය හා ප්‍රවාහනයේ දී සිදුවන හිංසයන් පිළිබඳ දැනුවත් කිරීම | √ | | |
| විවිධ ඉලක්කගත කාන්තාවන් (අඩු ආදායම්ලාභී, ධීවර, වතු, ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමවලින් පීඩාවට පත්) ආර්ථික වශයෙන් සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ ස්වයං රැකියා ව්‍යාපෘති ආධාර ලබා දීම - කාන්තාවන් සංඛ්‍යාව | √ | | |
| දේශපාලනයේ කාන්තා නියෝජනය වැඩිදියුණු කිරීම සඳහා පළාත් මට්ටමින් කාන්තා නියෝජිතයින් හා කාන්තා ඡන්ද අපේක්ෂිකාවන් දැනුවත් කළ සංඛ්‍යාව | | √ | |
| රැකියා උදෙසා විදේශගත වූ සහ විදේශගතවීමට ඉඩකඩ ඇති කාන්තාවන් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති සංඛ්‍යාව | √ | | |
| තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථාන වෙතින් සේවා සපයන ලද සේවාලාභීන් සංඛ්‍යාව | √ | | |
| උපදේශන මධ්‍යස්ථාන සඳහා යොමුවන ලද සේවාලාභීන් සංඛ්‍යාව | √ | | |
| උපදේශන දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගී වූ සේවාලාභීන් සංඛ්‍යාව | √ | | |
| ව්‍යවසායකයින් ලෙස සවිබලගැන්වූ වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන් සංඛ්‍යාව | √ | | |

# පරිච්ඡේදය 05

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු විෂය පථය සඳහා අරමුණු අංක -5 ප්‍රධාන වශයෙන් ම අදාළ වේ.

| අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0 % - 49 % | 50 % -74 % | 75 % - 100 % |
| 1. ස්ත්‍රී- පුරුෂ සමානාත්මතාවය ළඟා කර සියලු කාන්තාවන් හා ගැහැනු ළමුන් සවිබලගැන්වීම (SDG 05) | 1.1 කාන්තාවන්ට හා ගැහැනු ළමුන්ට එරෙහිව සියලුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස් කොට සැලකීම තුරන් කිරීම (5.1) | 1.1.1. කාන්තා රැකවරණ නිවාස හරහා සේවාවන් ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | | √ |
| | | 1.1.2 කාන්තා හා ළමා සංවර්ධන කමිටු රැස්වීම් සංඛ්‍යාව | | | √ |
| | | 1.1.3 කාන්තාවන් සවිබලගැන්වීමේ පනත අනුමත කිරීම හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිශතය | | | √ |
| | | 1.1.4 ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබලගැන්වීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | | √ | |
| | | 1.1.5 කාන්තා උපකාරක 1938 දුරකථන සේවාව හා ළමා උපකාරක 1929 දුරකථන සේවාවට ලැබුන ඇමතුම් සංඛ්‍යාව හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිශතය | | | √ |
| | | 1.1.6 පොදු ප්‍රවාහනයේදී සිදුවන ලිංගික හිංසනයන් අවම කිරීම සඳහා සිදු කරන ලද දැනුවත් කිරීම් සංඛ්‍යාව | | | √ |
| | | 1.1.7 කාන්තාවන්ට හා ළමුන්ට එරෙහිව සිදුවන හිංසනය අවම කිරීම සඳහා සිදු කරන ලද වැඩසටහන් සංඛ්‍යාව | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 1.2 මානව කුට්ටනය, ලිංගික සහ වෙනත් ආකාරයේ දූෂණයන් ද ඇතුළත්ව කාන්තාවන්ට හා ගැහුණු ළමුන්ට එරෙහිව පොදු හා පෞද්ගලික ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම (5.2) | 1.2 1. කාන්තා උපකාරක 1938 දුරකථන සේවාව හා ළමා උපකාරක 1929 දුරකථන සේවාවට ලැබුන ඇමතුම් සංඛ්‍යාව හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිශතය | | | √ |
| | | 1.2. 2. පොදු ප්‍රවාහනයේදී සිදුවන ලිංගික හිංසනයන් සයිබර් ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා සිදු කරන ලද දැනුවත් කිරීම් සංඛ්‍යාව | | | √ |
| | | 1.2.3. කාන්තාවන්ට හා ළමුන්ට එරෙහිව සිදුවන හිංසනය අවම කිරීම සඳහා සිදු කරන ලද වැඩසටහන් සංඛ්‍යාව | | | √ |
| | | 1.2.4. ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ දෙවන පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීම හා ක්‍රියාකාරකම් ආරම්භ කිරීමේ ප්‍රතිශතය. | | | √ |
| | | 1.2.5. ප්‍රජනන සෞඛ්‍ය අයිතිවාසිකම් පිළිබඳව පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | | | √ |
| | 1.3 ළමා විවාහයන්, බලහත්කාරයෙන් සිදුවන්නා වූ විවාහයන්, සහ කාන්තාවන්ගේ ලිංගික අවයව තුවාල කිරීම් වැනි සියලුම භාවිතාවන් තුරන් කිරීම (5.3) | 1.3.1 අඩු වයස් විවාහ වැළැක්වීම සඳහා පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | | | √ |
| | | 1.3.2 ළමුන්ට එරෙහි හිංසන වැළැක්වීමේ හා ප්‍රතිචාර දැක්වීමේ බහුආංශික වැඩසටහන් පැවැත්වීම- පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | | √ | |
| | 1.4 මහජන සේවාවන් යටිතල පහසුකම් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් සැපයීම තුළින් ගෙවීමක් සිදු නොකරන්නා වූ සේවාවන් සහ ගෘහාශ්‍රිත වැඩවල වටිනාකම හඳුනා ගැනීම, අගය කිරීම, සහ ජාතික වශයෙන් සුදුසු වන්නා වූ ආකාරයට නිවසේ සහ පවුලේ වගකීම් බෙදා ගැනීම ප්‍රවර්ධනය කිරීම (5.4) | 1.4.1 විවිධ ඉලක්කගත කාන්තාවන් (අඩු ආදායම්ලාභී, ධීවර, වතු, ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමවලින් පීඩාවට පත්) ආර්ථික වශයෙන් සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ ස්වයං රැකියා/ ව්‍යාපෘති ආධාර ලබාදුන් කාන්තාවන් සංඛ්‍යාව | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 1.5 දේශපාලන, ආර්ථික සහ සාමාන්‍ය ජීවිතයේ සියලුම අවස්ථාවන්හි තීරණ ගැනීමේදී කාන්තාවන්ට නායකත්වය හා සමාන අවස්ථාවන් සැලසීම හා ඵලදායී අන්දමින් සහභාගීවීම තහවුරු කිරීම (5.5) | 1.5.1. දේශපාලනයේ කාන්තා නියෝජනය වැඩිදියුණු කිරීම සඳහා පළාත් මට්ටමින් කාන්තා නියෝජිතයින් හා කාන්තා ඡන්ද අපේක්ෂිකාවන් බලගන්වන ලද සංඛ්‍යාව | | | √ |
| | 1.6 ජනගහනය සහ සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ වැඩ සැලැස්මට අනුකූලව එකඟ වූ පරිදි බීජිං ක්‍රියාකාරකම් සැලැස්ම සහ ඔවුන්ගේ සමාලෝචන සම්මන්ත්‍රණයේ ලේඛනවලට අනුකූලව ලිංගික, සහ ප්‍රජනන සෞඛ්‍ය සහ අයිතිවාසිකම් සඳහා සියලු දෙනාටම ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම (5.6) | 1.6.1. කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ හිංසන පිටු දැකීම පිළිබඳ ජිනීවා හි පැවති 91 වන සැසිවාරය සඳහා ශ්‍රී ලාංකික දූත කණ්ඩායමක් සහභාගී වීම හා කාලාන්තර වාර්තා සම්පාදනය කිරීමේ ප්‍රතිශතය | | | √ |
| | 1.7 කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා විශේෂයෙන්ම තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ඇතුළත්ව තාක්ෂණය ලබාගැනීම සඳහා සාධනීය අවස්ථාවන් ලබාදීම (5 b) | 1.7.1 අමාත්‍යාංශයීය ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් තොරතුරු තාක්ෂණ භාවිතාවන් පිළිබඳ පුහුණු කිරීමේ සංඛ්‍යාව | | | √ |
| | 1.8 ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ සියලු මට්ටම්වල කාන්තාවන් හා ගැහැනු ළමුන් සවිබල ගැන්වීම සඳහා යහපත් ප්‍රතිපත්ති යොදා ගැනීම සහ ශක්තිමත් කිරීම හා නීතිමය ලෙස බලාත්මක කිරීම ( 5. C) | 1.8.1 ස්ත්‍රී- පුරුෂ සමාජභාවීය අයවැයකරණ පනත සකස් කිරීම ආරම්භ කිරීමේ ප්‍රතිශතය | | | √ |
| | | 1.8.2 කාන්තාවන් සවිබලගැන්වීමේ පනත හඳුන්වා දීම හා ක්‍රියාවට නැංවීමේ ප්‍රතිශතය | | | √ |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග

i. ජාතික ක්‍රියාකාරී සැලසුම් හා පනත් ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධිත ආයතන/ අමාත්‍යාංශ සඳහා ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ප්‍රගතිය ගෙන්වා ගැනීමේ දී අසීරුතාවන්ට මුහුණ පෑමට සිදුවීම.
ii. වැඩසටහන් සම්බන්ධීකරණය සඳහා නිලධාරීන් හා සම්පත් හිඟ වීම.
iii. විෂය දැනුමට අදාළ සම්පත්දායකින් ප්‍රමාණවත් නොවීම.

# පරිච්ඡේදය 06

## මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

**කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය**

2025.12.31 දිනට

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/(අතිරික්ත)** | එකතුව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 27 | 21 | 6 | 54 |
| තෘතීයික | 17 | 13 | 4 | 34 |
| ද්විතීයික | 963 | 937 | 26 | 1,926 |
| ප්‍රාථමික | 75 | 56 | 19 | 150 |
| එකතුව | **1,082** | **1,027** | **55** | **2,164** |

**මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය**

2025.12.31 දිනට

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/(අතිරික්ත)** | එකතුව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 05 | 03 | 02 | 10 |
| තෘතීයික | - | - | - | - |
| ද්විතීයික | 388 | 386 | 02 | 776 |
| ප්‍රාථමික | 05 | 02 | 03 | 10 |
| එකතුව | **398** | **391** | **7** | **796** |

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

2025.12.31 දිනට

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 21 | 17 | 04 | 42 |
| තෘතීය | 17 | 07 | 10 | 34 |
| ද්විතීය | 567 | 273 | 294 | 1,134 |
| ප්‍රාථමික | 13 | 08 | 05 | 26 |
| එකතුව | **618** | **305** | **313** | **1,236** |

## 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය

**කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය**

පුරප්පාඩු ජ්‍යෝෂ්ඨ නිලධාරී තනතුරු සංඛ්‍යාව 06 වන අතර, එම තනතුරු පහත පරිදි වර්ගීකරණය කළ හැකිය.

ගණකාධිකාරී -01
සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (SLAS) -02
සහකාර ලේකම් -01
අභ්‍යන්තර විගණක -01
සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ(SLICTS) -01

තෘතීය මට්ටමේ නිලධාරී තනතුරු 17ක් අනුමත වී ඇති අතර, තනතුරු 04ක් පුරප්පාඩුව පවතී. එම පුරප්පාඩු වන්නේ භාෂා පරිවර්තක( සිංහල/ දෙමළ) තනතුරු 01ක්, උපදේශන නිලධාරී තනතුරු 02ක් හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරු 01කි .

ද්වීතියික මට්ටමේ සේවා ගණය තුළ නිලධාරී සංඛ්‍යාව සැලකිල්ලට ගැනීමේ දී නිලධාරී තනතුරු 963ක් අනුමත වී ඇති අතර, දැනට එම අනුමත තනතුරු වල නිලධාරීන් 937ක් සේවය කරනු ලබයි. ඒ අනුව තනතුරු 26ක් පුරප්පාඩුව පවතින අතර, එම පුරප්පාඩු වන්නේ සංවර්ධන නිලධාරී ඒකාබද්ධ සේවයේ තනතුරු 04ක්, වනිතා සංවර්ධන නිලධාරී (දෙපාර්තමේන්තු ගත) තනතුරු 01ක්, කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 09ක්, වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාර තනතුරු 01ක්,නේවාසිකාගාර පාලිකා තනතුරු 05ක්, සහකාර නේවාසිකාගාර පාලිකා තනතුරු 05ක් හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරු 01කි.

ප්‍රාථමික සේවා ගණය තුළ අනුමත තනතුරු සංඛ්‍යාව 75ක් වන අතර දැනට එම අනුමත තනතුරුවල නිලධාරීන් 56ක් සේවය කරනු ලබයි. ඒ අනුව පුරප්පාඩු 19ක් පවතින අතර, ඒ අතර රියදුරු තනතුරු 01ක්, තීරෝද රථ රියදුරු (කොන්ත්‍රාත්) තනතුරු 05ක්, අරක්කැමි තනතුරු 06ක්, කාර්යාල කාර්ය සහායක තනතුරු 02ක්, මධ්‍යස්ථාන සහායක තනතුරු 04ක් හා කැමරා ශිල්පී සහායක තනතුරු 01ක් පුරප්පාඩුව පවතී.

**මුල් ළමා විය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය**

පුරප්පාඩු ජ්‍යෝෂ්ඨ නිලධාරී තනතුර සංඛ්‍යාව 02ක් වන අතර, එම තනතුරු පහත පරිදි දැක්විය හැකිය.

සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (SLAS) - 02

ද්වීතීක මට්ටමේ නිලධාරී තනතුරු 388ක් අනුමත අතර අනුමත තනතුරු අතරින් තනතුරු 386ක් සේවය කරනු ලබයි. ඒ අනුව තනතුරු 02ක් පුරප්පාඩුව පවතින අතර, එම පුරප්පාඩු 02 වන්නේ කළමනාකරණ සේවා නිලධාරි තනතුරු 02කි.

ප්‍රාථමික සේවා ගණය තුළ අනුමත තනතුරු 05ක් පවතින අතර, දැනට එම අනුමත තනතුරුවල නිලධාරීන් 02ක් සේවය කරනු ලබයි. තනතුරු 03ක් පුරප්පාඩුව පවතින අතර, එම පුරප්පාඩු වන්නේ රියදුරු තනතුරු 02ක් සහ කාර්යාල කාර්ය සහායක තනතුරු 01කි.

## 6.3 මානව සම්පත් සංවර්ධනය (දේශීය පුහුණු)

| අ. අ | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව (අත්සන් ලේඛන අනුව) | වැඩ සටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (Rs'000) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| 1 | සේවා ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි විධායක නිලධාරීන් සඳහා වන පශ්චාත් උපාධි අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම. | 4<br>නිලධාරීන් දෙදෙනෙකු සඳහා පළමු වාරිකය<br>එක් නිලධාරියෙකු සඳහා දෙවන වාරිකය<br>එක් නිලධාරියෙකු සඳහා සම්පූර්ණ වාරික | අවු. 01 | 510.00 | දේශීය | සේවා ව්‍යවස්ථාවට අනුකූලව ධාරිතා සංවර්ධනය හා බැඳේ |
| 2 | ආයතන සංග්‍රහය - රාජකාරී ලිපි ලිවීම සහ සටහන් ලිවීම පිළිබඳ පුහුණුව | 61 | දින 1 | 15.48 | දේශීය | රාජකාරී ලිපි ලිවීම සහ සටහන් ලිවීම පිළිබඳ දැනුම |
| 3 | Clean Sri Lanka ව්‍යාපෘතිය යටතේ සුපිළිපන්න සහ දූෂණ විරෝධී පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 126 | දින 1 | 16.09 | දේශීය | සුපිළිපන්න සහ දූෂණ විරෝධී පනත පිළිබඳ දැනුම |
| 4 | 2018 අංක 18 දරන ජාතික විගණන පනත | 75 | දින 1 | 35.30 | දේශීය | 2018 අංක 18 දරන ජාතික විගණන පනත පිළිබඳ දැනුම |
| 5 | 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත 5 | 135 | දින 1 | 21.12 | දේශීය | 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත 5 පිළිබඳ දැනුම |
| 6 | ඵලදායීතාවය පිළිබඳ පුහුණුව | 41 | දින 1 | 21.44 | දේශීය | ඵලදායීතාවය පිළිබඳ දැනුම |
| 7 | පවුල් උපදේශනය පිළිබඳ පුහුණුව | 58 | දින 1 | 16.46 | දේශීය | පවුල් උපදේශනය පිළිබඳ දැනුම |
| 8 | ඇබ්බැහිවීම් සඳහා වන උපදේශනය | 38 | දින 1 | 9.98 | දේශීය | ඇබ්බැහිවීම් වලින් වැළකීම සඳහා කටයුතු කළ යුතු ආකාරය |
| 9 | වැටුප් ගෙවීම සම්බන්ධ පුහුණු | 1 | දින 3 | 21.00 | දේශීය | වැටුප් ගෙවීම සම්බන්ධ දැනුම |
| 10 | ව්‍යාපෘති යෝජනා සකස් කිරීම | 40 | දින 1 | 7.26 | දේශීය | ව්‍යාපෘති යෝජනා සකස් කිරීම පිළිබඳ දැනුම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 11 | වාහන ඇණිය කළමනාකරණය පිළිබඳ පුහුණුව | 2 | දින 1 | 13.00 | දේශීය | වාහන ඇණිය කළමනාකරණය පිළිබඳ දැනුම |
| 12 | පරිගණක දෘඩාංග පුහුණුව | 1 | මාස 8 | 49.60 | දේශීය | පරිගණක දෘඩාංග දැනුම |
| 13 | කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 2 | දින 1 | 74.29 | දේශීය | කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාල දැනුම |
| 14 | ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන | 17 | දින 1 | 90.30 | දේශීය | රාජ්‍ය සේවකයකු දැනගත යුතු නීති රෙගුලාසි පිළිබඳ දැනුම |
| 15 | නිල වෙබ් අඩවිය සම්බන්ධ පුහුණු වැඩසටහන (Website) | 18 | දින 02 | 46.04 | දේශීය | වෙබ් අඩවි අන්තර්ගත උඩුගත කිරීම හා කාලෝචිත යාවත්කාලීන කිරීම් |
| 16 | නිල මුහුණු පොත සම්බන්ධ පුහුණු වැඩසටහන (Facebook) | 10 | දින 01 | 11.33 | දේශීය | පුද්ගලික පැතිකඩ, පිටු සහ කණ්ඩායම් ඵලදායී ලෙස නිර්මාණය |
| 17 | LGN සහ LAN පුහුණු වැඩසටහන | 26 | දින 01 | 2.38 | දේශීය | දත්ත සහ අන්තර්ජාල ප්‍රවේශය බෙදා ගැනීම සඳහා පරිගණක සම්බන්ධ කර ඇති ආකාරය |
| 18 | ඊ - වාණිජ්‍යය පුහුණු වැඩසටහන | 25 | දින 01 | 9.91 | දේශීය | මාර්ගගත ව්‍යාපාර සංකල්ප, ඩිජිටල් අලෙවිකරණ උපාය මාර්ග |
| 19 | Advanced Adobe Photoshop | 6 | මාස 04 | 30.00 | දේශීය | රූප සංස්කරණය සහ ග්‍රැෆික් නිර්මාණ කාර්යයන් |
| 20 | Microsoft Access (මූලික) පුහුණු වැඩසටහන | 15 | දින 03 | 26.05 | දේශීය | නිරවද්‍යතාවය සහ භාවිතයේ පහසුව වැඩි දියුණු කිරීම සඳහා වලංගුකරණ පාලන, පතන ලැයිස්තු සහ ව්‍යුහගත සංචාලනය සමඟ පරිශීලක-හිතකාමී දත්ත ඇතුළත් කිරීමේ ආකෘති සංවර්ධනය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 21 | ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දැක්වීමේ ව්‍යසනය ශක්තිමත් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා සූදානම - මාතර දිස්ත්‍රික්කය | 100 | දින 01 | 0.12 | දේශීය | ආපදා කළමනාකරණය, ආපදා අවස්ථාවන්හිදී කාන්තාවන්ගේ සහ දරුවන්ගේ ආරක්ෂාව සහ ආරක්ෂාව ප්‍රවර්ධනය |
| 22 | නවීන තාක්ෂණය භාවිතයෙන් රාජ්‍ය සේවකයින්ගේ ආකල්පමය වෙනසක් සඳහා පුහුණු වැඩසටහන | 206 | දින 01 වැඩසටහන් 03 | 86.01 | දේශීය | විද්‍යුත් සේවා, මාර්ගගත වේදිකා සහ කාර්යාල ඵලදායිතා යෙදුම් ඇතුළු නවීන ඩිජිටල් මෙවලම් භාවිතය |
| 23 | රාජ්‍ය සේවකයින් සඳහා අත්‍යවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන් භාවිතය | 166 | දින 01 වැඩසටහන් 03 | 75.61 | දේශීය | වචන සැකසීම, පැතුරුම්පත්, ඉදිරිපත් කිරීම් සහ විද්‍යුත් තැපැල් සන්නිවේදනය ඇතුළුව පොදු කාර්යාල ඵලදායිතා යෙදුම් ඵලදායී ලෙස භාවිතා කිරීම |
| 24 | පරිගණක දෘඩාංග සහ ජාලකරණ ගැටලු නිරාකරණය කිරීම | 92 | දින 01 වැඩසටහන් 03 | 77.98 | දේශීය | පරිගණක සංරචක සහ පොදු දෘඩාංග සහ ජාලකරණ ගැටලු පිළිබඳ පැහැදිලි අවබෝධය |
| 25 | තොරතුරු තාක්ෂණය පාදක ව්‍යාපෘති අධීක්ෂණය සහ පරිගණක පාදක ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පුහුණුව | 44 | දින 02 | 440.00 | දේශීය | නවීන පරිගණක පද්ධති සහ මෘදුකාංග මෙවලම් භාවිතයෙන් ව්‍යාපෘති සැලසුම් කිරීම, කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 26 | ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දැක්වීමේ ආපදා සූදානම ශක්තිමත් කිරීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයට අනුයුක්තව සේවයේ නිරතවන කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ එක්දින වැඩසටහන | 150 | දින 01 | 173.76 | දේශීය | ආපදා කළමනාකරණය, ආපදා අවස්ථාවලදි තොරතුරු තාකෂණික අවභාවිතාවලින් ප්‍රජාව මුදවාගැනීමට කෘතිම බුද්ධිය අතුළු නවීන තාක්ෂණ භාවිතාවන් යොදා ගැනීම හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ආපදා කළමනාකරණය |
| 27 | ආරක්ෂාකාරී, නවීන පරිගණක, අන්තර්ජාල හා කෘතිම බුද්ධිය භාවිතය පිළිබඳ ප්‍රජා පාදක වැඩසටහන- වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය 2025.11.18 | 363 | පැය 4 | 70.27 | දේශීය | ආරක්ෂාකාරී, නවීන පරිගණක, අන්තර්ජාල හා කෘතිම බුද්ධිය භාවිතය පිළිබඳ දැනුම |
| 28 | කාන්තා සහ ළමා සංවර්ධනය සඳහා කෘත්‍රිම බුද්ධිය භාවිතය හා අභ්‍යන්තර කටයුතු ඒකකයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන - කොළඹ දිස්ත්‍රික්කය 2025.11.20 | 62 | පැය 4 | 230.95 | දේශීය | කාන්තා සහ ළමා සංවර්ධනය සඳහා කෘත්‍රිම බුද්ධිය භාවිතය සහ අභ්‍යන්තර කටයුතු ඒකකයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ දැනුම |

**මානව සම්පත් සංවර්ධනය (විදේශීය පුහුණු)**

| අ.අ | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| 1 | Liang Jia he to Common Prosperity -New Era China Cooperation Training Programme in China | 2 | 2025.01.10-2025.01. 21 | අනියම් දීමනාව USD 250 (X 2 = 500 USD) | විදේශීය | වැඩසටහන් විෂයට අදාළ දැනුම වර්ධනය |
| 2 | SIPCA Field Visit | 1 | 2025.02.16-2025.02.22 | අනියම් දීමනාව USD 150 GBP 75 | විදේශීය | වැඩසටහන් විෂයට අදාළ දැනුම වර්ධනය |
| 3 | 69 th Session of the Commission on the status of the women | 1 | 2025.03.08-2025.03.18 | අනියම් දීමනාව USD 150 | විදේශීය | වැඩසටහන් විෂයට අදාළ දැනුම වර්ධනය |
| 4 | Austrailia Awards Short Course on Bridging Research to policy | 1 | 2025.03.15-2025.03.29 | අනියම් දීමනාව USD 375 GBP 75 | විදේශීය | වැඩසටහන් විෂයට අදාළ දැනුම වර්ධනය |
| 5 | Seventh mid Career Training programme for Island service officers to sri lanka under the Indian technical & Economic Co-operation (ITEC) | 1 | 2025.03.15-2025.03.29 | අනියම් දීමනාව USD 350 | විදේශීය | වැඩසටහන් විෂයට අදාළ දැනුම වර්ධනය |
| 6 | Capacity Building and Consrtruction Workshop for Inclusive Climate policy and Planing | 1 | 2025.07.13-2025.07.16 | අනියම් දීමනාව USD 75 | විදේශීය | වැඩසටහන් විෂයට අදාළ දැනුම වර්ධනය |
| 7 | Early Childhood quality in new normal Era opportunities of community capacity | 1 | 2025.04.20-2025.5.03 | අනියම් දීමනාව USD 350 | විදේශීය | වැඩසටහන් විෂයට අදාළ දැනුම වර්ධනය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 8 | Regional meeting for TA 1027 Reg; Strengthning women's resilience to heat strss in Asia Pacific | 1 | 2025.06.01-2025.06.05 | අනියම් දීමනාව USD 100 GBP 75 | විදේශීය | වැඩසටහන් විෂයට අදාළ දැනුම වර්ධනය |
| 9 | Asia Pacific regional conference on Early Childhood Development | 1 | 2025.06.29-2025.07.05 | අනියම් දීමනාව USD 150 | විදේශීය | වැඩසටහන් විෂයට අදාළ දැනුම වර්ධනය |
| 10 | KOICA CIAT Training Programme on Capacity Building for Government Officer on Household Economy Development for Pease Building and Social Integration scheduled | 1 | 2025.06.22-2025.07.05 | අනියම් දීමනාව USD 350 GBP 75 | විදේශීය | වැඩසටහන් විෂයට අදාළ දැනුම වර්ධනය |
| 11 | Strength women's resilience to heat stress in Asia and the pacitic from 12th to 14 th august in incheon the republic of korea | 1 | 2025. 08.12-2025.08.14 | අනියම් දීමනාව USD 125 | විදේශීය | වැඩසටහන් විෂයට අදාළ දැනුම වර්ධනය |
| 12 | 2025 Asia Pacific Transform Care Learning Week from 04th -05 September | 1 | 2025.09.03-2025.09.06 | අනියම් දීමනාව USD 160 | විදේශීය | වැඩසටහන් විෂයට අදාළ දැනුම වර්ධනය |
| 13 | Capacity Building for police officers on Prevention and inwestigation of Sexual and Gender based violance (SGBV ) in Sri Lanka | 2 | 2025.09.06 -2025.09.21 | අනියම් දීමනාව USD 350 X 2 = 700 GBP 75 | විදේශීය | වැඩසටහන් විෂයට අදාළ දැනුම වර්ධනය |
| 14 | Knowledge Co-Creation programme Eradicating Sexual and Gender Based Violance (SGBV) | 1 | 2025.09.20-2025.10.11 | අනියම් දීමනාව USD 375 | විදේශීය | වැඩසටහන් විෂයට අදාළ දැනුම වර්ධනය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 15 | Gender respensive Governance in Entrepreneurship training programme under the indian Technical & Economic Cooperation (ITEC) Scholarship Scheme | 1 | 2025.10.05-2025.10.19 | අනියම් දීමනාව USD 350 | විදේශීය | වැඩසටහන් විෂයට අදාළ දැනුම වර්ධනය |
| 16 | Knowledge Co-Creation Programme Capacity Development for Empowerment of Rural women | 1 | 2025.11.02 -2025.11.29 | අනියම් දීමනාව USD 375 GBP 75 | විදේශීය | වැඩසටහන් විෂයට අදාළ දැනුම වර්ධනය |
| 17 | Pathfinding Global Aliance Conference on Ending Violance Against Children | 1 | 2025.11.11 -2025.11.15 | අනියම් දීමනාව USD 160 | විදේශීය | වැඩසටහන් විෂයට අදාළ දැනුම වර්ධනය |

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යභාරයන් සාක්ෂාත් කිරීම පිණිස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සෑම අංශයක් හා ආයතනයන් සතු මානව සම්පත විෂයානුබද්ධව හා තාක්ෂණික දැනුමෙන් බලගැන්විය යුතු අතර, ඊට සමාන්තරව සිය වගකීම් නිසියාකාරව ඉටු කිරීමට පෙළඹවීම සඳහා නිසි මඟ පෙන්වීම් සහිත ආකල්ප සංවර්ධන වැඩසටහන්වලට නිරන්තරයෙන් යොමුකළ යුතු වේ.

එම අරමුණු පෙරදැරිව ක්‍රියාත්මක කරන ලද ඉහත සඳහන් පුහුණු වැඩසටහන් තුළින් සියලුම නිලධාරීන්ගේ විෂයානුබද්ධ හා තාක්ෂණික දැනුම වර්ධනය කිරීම සිදුවන අතරම මෙම අමාත්‍යාංශය මඟින් ප්‍රතිලාභ ලබන කණ්ඩායම් හට ඵලදායී සේවයක් සැලසීම සඳහා නිලධාරීන් තුළ මානසික අභිප්‍රේරණයක් ඇතිවේ. එමඟින් අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල කාර්යසාධනය ඉහළ නැංවීම උදෙසා විශාල දායකත්වයක් සපයනු ලබයි.

# පරිච්ඡේදය 07

## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශණ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.6 | වෙනත් | - | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛණය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභි නියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/204 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134 (2) DMA/1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1 – 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම් , තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛණයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | වාර්ෂික කාර්ය සාධන ගිවිසුම අත්සන් කර තිබීම අවශ්‍ය නොවන බව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ චක්‍රලේඛයන් මඟින් සඳහන් කර ඇත. | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

5 වන මහල, දෙවන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල
05 ஆம் மாடி, கட்டம் II, செத்சிறிபாய, பத்தரமுல்ல
05th Floor, Stage II, Sethsiripaya, Battaramulla